# 20 කාගෙද කාටද ?

නියමුවා ප්‍රකාශන

# 20 කාගෙද? කාටද?

2020 සැප්තැම්බර් 24වැනිදා ජනතා විමුක්ති පෙරමුණ විසින්
**"20 කාගේද? 20 කාටද?"** යන මැයෙන්
පැවැත්වූ සම්මන්ත්‍රණයේදී
ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින්
පැවැත්වූ දේශනය

# 20 කාගෙද? කාටද?

නියමුවා ප්‍රකාශන

# 20 කාගෙද? කාටද?

© නියමුවා ප්‍රකාශන

පළමු මුද්‍රණය : 2020 ඔක්තෝබර්

**මුද්‍රණය හා ප්‍රකාශනය:**
නියමුවා ප්‍රකාශන,
43/20, නුගගහ පෙදෙස,
පිළියන්දල පාර,
මහරගම.

**විමසීම්:**
දුරකථනය-: +94112785612
ෆැක්ස්-: +94112786050
විද්‍යුත් තැපෑල-: niyamuwanews@gmail.com
වෙබ්-: www.jvpsrilanka.com

# වචනයක්...

ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙනවිත් තිබෙන ‘20‘වැනි සංශෝධනය පිළිබඳ විශාල කථිකාවක් සමාජය තුළ ඇතිවී තිබේ. මෙහිදී විවිධ දේශපාලන කඳවුරු තම තමන්ගේ දේශපාලන හා පංති වුවමනාවන් මත පිහිටා 20 පිළිබඳ ප්‍රතිචාර දක්වනු පෙනේ.

ආණ්ඩුවේ බලය හොබවන රාජපක්ෂ කඳවුරට අනුව මෙය එක් අතකින් ජනාධිපති ගෝඨාභයට ‘වැඩ කිරීමට’(?) ඇති බාධා ඉවත් කරන්නක් වන අතර අනෙක් අතින් 19වැනි සංශෝධනයේ “අවුල් ජාලය” නිවැරදි කිරීමකි. සැබැවින්ම 19වැනි සංශෝධනය අවුල් ජාලාවක් නම් ‘19’ දුර්වල කරමින් එම අවුල නිර්මාණය කළේද රාජපක්ෂ හවුල තුළ සිටින අයමය.

අනෙක් අතට එ.ජා.ප.යට සම්බන්ධ ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී මනෝරාජික චින්තනය ඇති පිරිස් මෙය ‘19’ ආපසු හැරවීමක් ලෙස දකිති. ඔවුනට අනුව ‘19’ යනු ප්‍රජාතන්ත්‍රවාදයේ ඉහළම අවස්ථාවය! ඒ නිසා 19 බේරා ගැනීම වෙනුවෙන් ඔවුහු ‘20’ට විරුද්ධ වෙති.

ඒ අතර එ.ජා.ප. කණ්ඩායම් දෙකම තමන් පසුගිය මැතිවරණයේදී ලද පරාජය වෙනස් කර ගැනීම අරමුණු කරගෙන ප්‍රජාතන්ත්‍රවාදයට කැමති බලවේග එකතු කර ගැනීමේ ‘කෙමනක්’ ලෙසද ‘20’ට එරෙහි විරෝධය යොදා ගැනීමට උත්සාහ කරයි.

මේ නිසා 20ට එරෙහිව හා පක්ෂව තිබෙන මතවාද හා විග්‍රහයන් වටහා ගත යුතුව ඇත්තේ ඒ පිටුපස වන පංතිමය හා දේශපාලන වුවමනාවන්ද වටහා ගනිමිනි.

ජ.වි.පෙ.ට අනුව ‘20’ ලංකාව තුළ අධිරාජ්‍යවාදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට, ඊට එරෙහිවන ජනතා බලවේග පාගා යටපත් කිරීමට අවශ්‍ය ඒකාධිපති බලයක් නිර්මාණය කර ගැනීම සඳහා ගන්නා උත්සාහයකි. ජ.වි.පෙ. 19 ගෙන ඒමට සහාය දුන් බව සත්‍ය වුවත් ‘19’යනු ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදයේ ඉහළම

ජයග්‍රහණය ලෙස අර්ථකථනය කර ගන්නේ නැත. රාජපක්ෂවරු ඊට පෙර ගෙනා 18වැනි සංශෝධනයට සාපේක්ෂව 19 ප්‍රජාතන්ත්‍රවාදය දෙසට තැබූ පියවරක් ලෙස දකින ජ.වි.පෙ. එහි සීමාකම් හා අඩුපාඩුද දකියි. වර්තමානයේ පවතින බෙලහීන දූෂිත ධනපති ක්‍රමය තුළ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය පවා පූර්ණ ලෙස ලබාදීමට ධනපති පාලකයන්ට නොහැකි බව ඉතා පැහැදිලිය. එබැවින් 19 පිළිබඳ ඇගයීම මෙන්ම 20 පිළිබඳ විරෝධයද පංතිමය අර්ථයෙන් තේරුම් ගත යුතු එකක් වේ.

20වැනි සංශෝධනය වත්මන් නව ලිබරල්වාදී ආර්ථික හා දේශපාලන ව්‍යාපෘතිය සමග බැඳී ඇතැයි අප කියන විට සමහරු එය වටහා ගන්නේ පටු අර්ථයෙන් බව පෙනේ. ඊනියා ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීන්ට අනුව වැරැද්ද ඇත්තේ 'නව ලිබරල්' ක්‍රමය තුළ මිස ධනවාදය තුළ නොවේ. ධනවාදය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදීකරණයට ලක් කළ විට සියල්ල හොඳින් සිදුවන බවත් එය එසේ කළ හැකි බවත් සමහර මහත්වරු සිතති; එලෙස සිහින දකිති. එහෙත් එය මායාවක් බව අපි දනිමු.

නව ලිබරල්වාදය යනු ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදයේ වර්තමාන ප්‍රකාශනය මිස අන් යමක් නොවේ. මීට වසර 500කට පමණ පෙර ධනවාදය සමාජ ක්‍රමයක් ලෙස බිහිවන විට එය හැඳින්වූයේ ලිබරල් ධනවාදය ලෙසය. නැතිනම් රාජ්‍ය නිර්බාධිත ධනවාදය, නිදහස් ධනවාදය ලෙසය. ඒ ධනවාදයේ යෞවන අවදියයි. එහෙත් 19වැනි සියවසේදී අර්බුදයට ගිය ධනවාදය 20වැනි සියවස ආරම්භ වන විට එහි ආකාරය වෙනස් කර ගනිමින් ඒකාධිකාරී ධනවාදය හෙවත් අධිරාජ්‍යවාදී අවදියට පැමිණුනි. මෙය හෙළි කළේ ලෙනින් විසිනි.

ඉන්පසු සමාජවාදී කඳවුර බිහිවී ලෝකය තුළ කඳවුරු දෙකක් ඇතිවූ විට අධිරාජ්‍යවාදය 20වැනි සියවස මැද භාගයේ කිසියම් සුභසාධක ස්වරූපයක් පවත්වා ගැනීමට උත්සාහ කළේය. එහිදී පරිධියේ ධනපති රටවල් රැසක රාජ්‍ය ඒකාධිකාරී ධනවාදය පවත්වාගෙන යන ලදී. ජනසතු ව්‍යාපාර මගින් රාජ්‍ය දේපළ පංගුව වැඩිකරන ලදී. ඒ සමාජවාදී මතවාදයේ බලපෑමට මුහුණදීම සඳහාය. එහෙත් ඒ තුළ අර්බුදයට ගිය අධිරාජ්‍යවාදය සිය රාජ්‍ය ඒකාධිකාරී, සුබසාධනවාදී ස්වරූපය වෙනස්කරමින් 1975 න් පසු කාලය තුළ නව ලිබරල්වාදී උපායමාර්ගයට පිවිසුණි. ගෝලීයකරණය, විවෘත ආර්ථිකය, වෙළඳපොළ ආර්ථිකය යන නම්වලින් මෙය හඳුන්වනු ලැබූ අතර එහි අරමුණ වූයේ, ගෝලීය ප්‍රාග්ධනයට

නිදහසේ වර්ධනය වීමටත් ලෝක වෙළඳපොළක් නිර්මාණය කොට එය අත්පත් කරගෙන ස්වාභාවික සම්පත් හා වෙළඳපොළ මගින් ශ්‍රමය සූරාකෑමත්ය.

සෝවියට් දේශය ප්‍රමුඛ සමාජවාදී කඳවුර බිඳ වැට්ටවීමට දායක වූ අධිරාජ්‍යවාදය 1990 එය බිඳවැටීමත් සමග ඉන් ලද වාසිය හා ඉඩකඩද උපයෝගී කරගෙන ලෙව පුරා වේගයෙන් ක්‍රියාත්මක විය. ඒ අනුව නව ලිබරල්වාදය යනු අධිරාජ්‍යවාදය මේ මොහොතේ ක්‍රියාත්මක වන ආකාරයම වේ. එය ඉවත් කොට ධනවාදය ලිබරල්කරණයට ලක්කිරීමට සිතීම මනෝ විකාරයකි. ලෝක ධනවාදයට තවදුරටත් මේ මිහිතලය මත සැබෑ ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීමට හෝ 'සාධාරණ සමාජය' බිහිකළ නොහැක. දැන් මේ මිහිතලය මත සැබෑ ලෙසම ප්‍රජාතන්ත්‍රවාදයත්, සමාජ සාධාරණත්වයත් ගොඩනැගිය හැක්කේ සමාජවාදයටම පමණි. කවුරු පිළිගැනීමට අකමැති වුවත් සත්‍යය එයයි.

අප 20වැනි සංශෝධනය දෙස බැලිය යුත්තේ මෙම පදනම මත පිහිටාය. 20වැනි සංශෝධනය යනු ගෝඨාභයගේ පුද්ගල හිතුවක්කාරකමක හෝ කැමැත්තක ප්‍රතිඵලයක්ම නොවේ. ඔහුට එවැනි කැමැත්තක් තිබිය හැකි වුවත් '20' පිටුපස වන සැබෑ අරමුණ වන්නේ ලංකාවේ දුර්වල, පසුගාමී ධනවාදය නව ලිබරල්වාදී ව්‍යාපෘතිය තුළ රැගෙනයාමේදී මතුවන ප්‍රතිවිරෝධයන්ට මුහුණ දිය හැකි තනි ඒකාධිපති බලයක් නිර්මාණය කර ගැනීමය. එබැවින් 20 අධිරාජ්‍යවාදයේ සමාජ ආර්ථික වුවමනා සමග ගැටගැසී පවතී. 20 පැරදවීමට අධිකරණ ක්‍රියාමාර්ග අදාළ නොවන්නේ මේ යථාර්ථය තුළය.

මේ තත්වය මත ජනතා විමුක්ති පෙරමුණ "20 කාගේද? 20 කාටද?" යන මැයෙන් පසුගිය සැප්තැම්බර් 24 වැනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේ පැවැත්වූ සම්මන්ත්‍රණයේදී ජ.වි.පෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා විසින් පැවැත්වූ දේශනය කාලීන වැදගත්කමක් දරන නිසාත් ඉහත දේශපාලන තත්වය පැහැදිලි කිරීමට ඒ මගින් උත්සාහ දරා තිබෙන නිසාත් එය පොත් පිංචක් ලෙස මුද්‍රණය කිරීමට අපි තීරණය කළෙමු. මෙය '20' පිළිබඳ වෙනස් දේශපාලන හා පංතිමය කියවීමකට සියලු දෙනාට මඟ පෙන්වනු ඇතැයි අපි සිතමු.

***නියමුවා ප්‍රකාශන***

***2020 ඔක්තෝබර් 08***

ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගෙන් අවසරයි, ඒ වාගේම වේදිකාවේ ඉන්න ජාතික ජන බලවේගයේ පාර්ලිමේන්තු මන්ත්‍රිනි, හරිනි අමරසූරිය සහෝදරියගෙනුත්, ඒ වාගේ ම අපේ පක්ෂයේ මධ්‍යම කමිටු සාමාජික, වෛද්‍ය නලින්ද ජයතිස්ස සහ සුනිල් වටගල සහෝදරවරුන්ගෙනුත් අවසරයි. 'විස්ස කාගෙ ද? විස්ස කාට ද?' කියන තේමාව යටතේ අපේ කතාබහට ඇහුම්කන් දෙන්න පැමිණ සිටින ආදරණීය මවුවරුනි, පියවරුනි, සහෝදර, සහෝදරියනි, මාධ්‍යවේදී හිතවතුනි, ඔබ සියලු දෙනාගෙන්ම අවසරයි.

අපේ රට තුළ දැනටමත් විසිවැනි සංශෝධනය පිළිබඳව සැලකිය යුතු සංවාදයක් ඇති වී තිබෙනවා. විසිවැනි සංශෝධනය පිළිබඳව විවිධ පාර්ශ්ව තම තමන්ගේ පැත්තේ සිට කරුණු දක්වන්න පටන් ගෙන තියෙනවා. අපේ රටේ තවත් ගැටලු ගොඩක් තියෙනවා. මේ ආණ්ඩුව එන කොට දීපු පොරොන්දු එකක්වත් ඉටු වෙලා නැහැ. විශාල ආර්ථික අර්බුදයක් තියෙනවා. ණය බර වැඩිවෙලා. සහල් මිල වැඩි වෙලා තියෙනවා. පොල් සීයට ගිහින් තියෙනවා. මේ හැම දේම ගැනත් අපට සංවාදයක් තියෙන්න ඕනෑ. නමුත්, මේ වෙලාවේ නිශ්චිත ලෙස ගත්තොත්, විසිවැනි සංශෝධනය පිළිබඳව සැලැකිය යුතු සාකච්ඡාවක් තියෙනවා. මේ සාකච්ඡාව ඉතා ම පටු තැනක හිර කරනවා වෙනුවට අපි කල්පනා කළා එය පුළුල් තැනකට ගෙනියන්න ඕනෑ කියලා. නැත්නම්, විස්ස පිළිබඳ සාකච්ඡාව නැවත වතාවක් බලය අහිමි වුණු කණ්ඩායම්වල අවශ්‍යතා වෙනුවෙන් කිහිප දෙනෙක් එකතු කර ගැනීමේ වේදිකාවක් කර ගන්නවා වෙනුවට ජනතාවට ඇත්ත අර්ථයෙන්

ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කරන, ඇත්ත අර්ථයෙන් ජනතාවට සමාජ වෙනසකට ජනතාවට මඟ විවර කරන දේශපාලන බලයක් නිර්මාණය කිරීමේ පැත්තට මේ සංවාදය හරවන්න ඕනෑ කියලා ජනතා විමුක්ති පෙරමුණේ අපි කල්පනා කළා.

විසිවැනි සංශෝධනය පසුගිය දවසක පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ විස්ස අස්සේ තියෙන්නේ මොනවාද කියලා කවුරුත් කතා කරනවා. ඒ වාගේම විස්ස පස්සෙ තියෙන්නේ මොනවාද කියලත් කතා කරන්න ඕනෑ. ඒ නිසයි අපි 'විස්ස කාගෙද? විස්ස කාටද?' කියන මාතෘකාවෙන් මේ සම්මන්ත්‍රණය පවත්වන්නේ.

මීට කලින් විසිවැනි සංශෝධනයක් තිබුණා. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම සඳහා වන සංශෝධන කෙටුම්පතක් සකස් කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබුණා. ඒක තමයි ඇත්තටම ගෙන ආ යුතුව තිබුණු සංශෝධනය. 19වැනි සංශෝධනයෙන් ඉදිරියට යන සංශෝධනය ඒකයි. ඒත් ඒක පැත්තකට දාලා තමයි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා එයාගේ විස්ස ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තියෙන්නේ. මේ විස්සෙන් කරන්න යන්නේ, 1978 ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හදපු ව්‍යවස්ථාව විසිවැනි වතාවට සංශෝධනය කරන එක. මේ දැන් පවතින ව්‍යවස්ථාව ජේ.ආර්. ජයවර්ධන මහත්තයා හදන කොට එදා හිටපු විපක්ෂය, සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේකට බරපතළ ලෙස විරුද්ධ වුණා. මේක ඒකාධිපති ව්‍යවස්ථාවක් ලෙස හැඳින්වූවා. ඊට පස්සේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජනාධිපති ධුරය දරන කාලයේ මේක හැඳින්වූයේ, 'ජේ.ආර්.ගේ බහුබූත ව්‍යවස්ථාව' කියලා. දැන් වෙලා තියෙන්නේ, මේක ඒකාධිපති ව්‍යවස්ථාවක් කියලා හඳුන්වපු සිරිමා බණ්ඩාරනායක මහත්මියගේ පක්ෂයේ හිටපු අය, ඒ වාගේම චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ආණ්ඩුවේ හිටපු ජේ.ආර්.ගේ බහුබූත ව්‍යවස්ථාව කියලා හඳුන්වපු අය, එයා වටේ හිටිය අය දැන් මහින්ද රාජපක්ෂ මහත්තයලාගේ, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාලාගේ වටේ ඉඳගෙන ජේ.ආර්.ගේ ව්‍යවස්ථාවම තව ශක්තිමත් කර ගන්නට විසිවැනි සංශෝධනය ගෙනැවිත් තිබීමයි. මෙතන තියෙන බේදවාචකය ඒකයි.

## සිහින හා බල ලෝභය

ඇත්තටම දැන් මේ ගොල්ලන්ට ජේ.ආර්. වැහිලා ඉන්නේ. ගෝඨාභය රාජපක්ෂලාට, මහින්ද රාජපක්ෂලාට ජේ.ආර්. වැහිලා ඉන්නේ. ජේ.ආර්.ගේ අවතාරය අයින් කරනවා වෙනුවට මේ 20 මගින් ඒ අවතාරය වැළඳ ගත්තු බව දකින්න තියෙනවා. ඒ ගොල්ලන්ට ජේ.ආර්. වැහුණාට අපට කමක් නැහැ. නමුත්, ජේ.ආර්. වැහුණාම ඒක ජනතාවට හොඳ වෙන්නේ නැහැ. ඒ නිසා ජනතාව අවදියෙන් ඉන්න ඕනෑ. විශේෂයෙන් අර ගෝඨාභයලාව දිනවන්න ඡන්දය දීපු හැටනව ලක්ෂයේ අය. මේ ජාතියේ සෙල්ලම් කරන්න ඡන්දය දීපු අයටත් එක්කමයි මේකෙ අනතුර එන්නේ. ඒ නිසා අපේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන විතරක් නොවෙයි, ප්‍රජාතන්ත්‍රවාදය යටතේ ජීවත් වෙන්න කැමැති හැමෝටමත් දැන් බල කෙරිලා තියෙනවා, විස්සේ අනතුර වටහා ගන්න. විස්ස කුමක් සඳහාද ගේන්නේ? මේක පිටිපස්සේ ඉන්නේ කවුද කියන කාරණා පිළිබඳව ගැඹුරු සංවාදයක් ඇති කර ගන්න අවශ්‍යයි. ලෝකයේ කොහේවත් නැති ජනාධිපතිවරයෙක් නිර්මාණය කර ගන්න 1978 ව්‍යවස්ථාව හැදුවාට පස්සේ සංශෝධන දහනවයක් මේ දක්වා කරලා තියෙනවා. මේ දහනවයෙන් දෙකයි තියෙන්නේ, ප්‍රජාතන්ත්‍ර විරෝධී තත්වයන් කිසියම් හෝ ප්‍රමාණයකින් ප්‍රජාතන්ත්‍රවාදය දෙසට හරවන්න දායක වුණු. එකක් තමයි, චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ඉන්න කාලේ ගෙනාපු දහහත් වැනි සංශෝධනය. ඒක ගේන්න මැදිහත් වුණේ අපි. ඒ වෙලාවේ තිබුණේ, දුර්වල වෙච්ච ආණ්ඩුවක්. ආණ්ඩුව දුර්වල වුණු වෙලාවක ඒ බල තුලනය පාවිච්චි කරලා, අඩුපාඩුකම් තිබුණත්, දහහත්වැනි සංශෝධනය ගෙනාවා. ඒකෙන් තමයි, ස්වාධීන කොමිෂන් සභා ඇති කරලා, හැත්තෑ අටේ ව්‍යවස්ථාවේ තිබුණු ඒකාධිපතිත්වයට කිසියම් හෝ වෙනසක් කරන්න හැකි වුණේ.

ඉන් පස්සේ මහින්ද රාජපක්ෂ මහත්තයලා දහඅටවැනි සංශෝධනය ගෙනැල්ලා, දහහතේ තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ සියල්ල අනික් පැත්ත හැරෙව්වා. ඊට පස්සේ නැවත වතාවක් 2015 කාලයේ දහනවවැනි සංශෝධනය ගෙනැත් මේ ව්‍යවස්ථාවට කිසියම් ප්‍රමාණයකින් ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ එකතු කරන්න උත්සාහයක් දැරුවා. ඒකටත් අපි මැදිහත් වුණා.

දහනවවැනි සංශෝධනය පරිපූර්ණ එකක් කියන එක නොවෙයි, මම කියන්නේ. දහනවවැනි සංශෝධනයෙන් සියල්ල විසඳෙන්නේ නැහැ. නමුත්, තිබුණු ව්‍යවස්ථාවේ ඒකාධිපතිත්වය කිසියම් ප්‍රමාණයකට අඩු කරලා, ජනතාව වෙනුවෙන් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම කිසියම් ප්‍රමාණයකට හෝ රකින්න උත්සාහ ගත්තු එකක්. මොක ද? අපි දන්නවා, මේ සමාජය ඇතුළේ ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනයට පුදුමාකාර බලයක් හදාගෙන තියෙනවා. ධනපති දේශපාලන පක්ෂවල ඉන්න හැම හොරාම, හැම තක්කඩියාම වැඩිපුර කියන වචනය තමයි, ප්‍රජාතන්ත්‍රවාදය. හැබැයි, ඒ ගොල්ලෝ ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්ම ගැන අමතක කරලා තියෙන්නේ. අපි දන්නා ආකාරයට ප්‍රජාතන්ත්‍රවාදයේ මූලධර්මය හඳුන්වන්නේ, 'සංවරණය හා තුලනය' (Check and Balance) කියලා. බලය සංවරණය වෙන්න ඕනෑ. ඒ වාගේම තුලනය වෙන්න ඕනෑ. හැබැයි, මේ ගොල්ලන්ගේ ඇත්ත අභිලාෂය සංවරණය, තුලනය සම්පූර්ණයෙන් අයින් කරලා දාලා, ව්‍යවස්ථාදායක, විධායක, අධිකරණ සියලු බලතල එක තනි මිනිහෙක් අතට ගන්න එක.

දහනවය අහෝසි කර විස්ස ගේන්න හේතුව මොකක්ද? හේතු ගොඩක් තියෙන්න පුළුවන්. බැලූබැල්මට තියෙන්නේ, බලය සඳහාවූ තණ්හාව. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ආසාවෙන් ඉන්නවා, අයියා රජ කරපු කාලේ වාගේ සියලු බලතල අතේ තියාගෙන, කාටවත් වගකියන්නේ නැතිව, ඒකාධිපතියෙක්, රජෙක් වගේ රට පාලනය කරන්න. අපි හිතනවා, ඒක දක්ෂකමක් නොවෙයි, දුර්වලකමක්. පාලකයන්ගේ තියෙන දක්ෂකම සියලු ආයතන උපයෝගී කර ගනිමින්, ප්‍රජාතන්ත්‍රවාදී විදියට කවුරුත් එකතු කර ගත්ත ක්‍රමයක් තුළින් පාලනය කිරීම. හැබැයි, දැන් හදන්නේ තනි අතට ඔක්කොම බලය ගන්න. විස්ස ගෙනැල්ලා ගන්න හදන්නේ, මොන බලයද? දහනවයෙන් කරලා තිබුණේ, ජනාධිපතිවරයා වෙත තිබුණු බලතල අඩු කිරීම, හා ඉවත් කිරීම, ඉන් කිසියම් ප්‍රමාණයක් ස්වාධීන කොමිෂන් සභාවලට ටිකක් දුන්නා. තව ටිකක් පාර්ලිමේන්තුවට දුන්නා. තව ටිකක් අගමැතිට, ඇමති මණ්ඩලයට දුන්නා. දැන් අගමැති කවුද? මහින්ද රාජපක්ෂ මහත්තයා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ අයියා. ඒ ගොල්ලන්ගේ බලලෝභය කෙතරම්ද කිවුවොත්, අයියා ළඟ බලය ටිකක් තියෙනවාටත් මල්ලි කැමැති නැහැ. අපි හිතුවේ, කලින් දහනවයේ ගැටලුව තිබුණේ, පක්ෂ

දෙකක දෙන්නෙක් දෙපැත්තේ හිටිය නිසා කියලා. ජනාධිපති මෛත්‍රීපාල මහත්තයා, අගමැති රනිල් වික්‍රමසිංහ මහත්තයා. නමුත්, බලය සම්බන්ධ ගැටලුව ඒක නොවෙයි. එක කුසේ ඉපදිලා ආවත්, බලය නම්, බලය. අපේ රටේ ඉතිහාසය ලියවෙලා තියෙන්නෙත් එහෙම නේ. අපේ රටේ ලියවිලා තියෙන්නේ, තාත්තා මරලා, පුතා රජ වුණු ඉතිහාසයක්; අයියා මරලා, මල්ලි රජ වුණු ඉතිහාසයක්; රජතුමා මරලා, බිසව රජ වුණු ඉතිහාසයක්; රජා මරලා දොරටුපාලයා රජ වුණු ඉතිහාසයක්. ඒ ඉතිහාසයෙන් ආපු රජ පරම්පරාවක් වගේ හිතන, වර්තමානය මේ ගොල්ලෝ කියලයි හිතෙන්නේ.

දැන් අයියා මරන්න බැරි නිසා අයියා අක්‍රිය කරලා, ඒ බලතල ටික මල්ලිට ගන්න මේක ගෙනැත් තියෙන්නේ. ඒ නිසා මෙතැන බලලෝභය තියෙනවා. අයියටයි, මල්ලිටයි බලය බෙදාහදාගෙන ජීවත් වෙන්න බැහැ කියලා මේකෙන් ඔප්පු කරලා තියෙනවා. එතකොට වෙන අයත් එක්ක කොහොමද බලතල බෙදාගෙන සමඟියෙන් කටයුතු කරන්නේ? අයියටයි, මල්ලිටයි බලතල බෙදාහදාගෙන සමඟියෙන් ජීවත් වෙන්න බැරුව සියලු බලතල මල්ලිට ඕනෑ වෙලා තියෙනවා නම්, ඒකෙන් පෙන්වන්නේ එක පැත්තකින් මේ ගොල්ලො කොතරම් දුර්වලද? අනෙක් පැත්තෙන් කොතරම් බලලෝභීද කියලා. ඒ නිසා බල තණ්හාව කියන එක විසිවැනි සංශෝධනය ඇතුළේ තියෙනවා. අනෙක් පැත්තෙන් ගෝඨාභය රාජපක්ෂ මහත්තයලා දේශපාලනයට වඩා හමුදාවල වැඩ කරලා පුරුදු අය නිසා ඒ ගොල්ලෝ හිතනවා, මේක ලේසි ක්‍රමය කියලා. ඔය කියන කරුණු දෙකත් මේ තුළ යම් තරමක් ඇති.

## අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය

ඊට අමතරව ප්‍රබල ලෙසම මේක පිටුපස අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය තියෙනවා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට අනාගතයේ කරන්න වෙන්නේ මොකක්ද කියලා එයා හොඳටම දන්නවා. ඡන්ද කාලේ කියපු ඒවා එකක්වත් එයාට කරන්න වෙන්නේ නැහැ. එදා කියපු සුරංගනා කතා එකක්වත් කරන්න වෙන්නේ නැහැ. එයා වෙනුවෙන් ඡන්ද කාලයේ අපට සුරංගනා කතා කියපු දේශහිතෛෂීත්වය පිළිබඳව, දේශප්‍රේමීත්වය පිළිබඳව

රට පිළිබඳව අපේ දේ පිළිබඳව, ජාතික දේපළ පිළිබඳව, විනය පිළිබඳවූ සැමට සාධාරණ නීතිය පිළිබඳව කියපු කතන්දර කිසිම එකක් සිද්ධ වෙන්නේ නැහැ. ඒ වෙනුවට අධිරාජ්‍යවාදීන්ගේ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න සිද්ධ වෙනවා. එම්.සී.සී. ගිවිසුම් අත්සන් කරන්න වෙනවා. අපේ ඉඩම් ටික, වතුර ටික, රටේ සම්පත් විකුණන්න වෙනවා. එතකොට මතු වෙන තත්වයක් තියෙනවා. ඒ අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරන්න නම්, තනි අතේ බලය තියා ගත්තු ඒකාධිපතිත්වයක් ඕනෑ වෙනවා. මේ සංශෝධන ගෙන ඒමේ ඇත්ත අරමුණ දිහා බැලුවොත්, අපට පැහැදිලි වෙන්නේ ඉතාමත් පටු බලලෝභීත්වය සහ කෑදරකම වගේම අනෙක් පැත්තෙන් ගත්තොත්, ඊට වඩා පුළුල් ලෙස පැතිරුණු අධිරාජ්‍යවාදී න්‍යාය පත්‍රයට අනුව වැඩ කිරීම. එහෙම වැඩ කරන්න වෙන කොට, නව ලිබරල්වාදය කරපින්නාගෙන යන කොට සමාජයෙන් මතුවන විරෝධයන් යට කරගෙන යන්න මේ වාගේ බලයක් අනිවාර්යයෙන්ම ඕනෑ. කම්කරු නීති වෙනස් කරලා වැඩ කරන ජනයා බහු ජාතික සමාගම්වල වහල්ලු කරන්න ඕනෑ. ඒ වෙනුවෙන් තමයි, විසිවැනි සංශෝධනය ගේන්න සිද්ධ වෙලා තියෙන්නේ. විස්ස පිටුපස්සේ තියෙන්නේ, ඔන්න ඔය වුවමනාව කියලා අපි දකිනවා.

මේ විසිවැනි සංශෝධනය ආවේ කොහොම ද? ඒක හරි අමුතු විදියකට ආවේ. මැතිවරණ කාලයේ ගෝඨාභය රාජපක්ෂ මහත්තයාගේ ප්‍රතිරූපය ගොඩනගන්න කටයුතු කරපු උදවිය, සමහර විද්වතුන් යැයි කියා ගන්නා උදවිය, සමහර භික්ෂූන් වහන්සේලා, සමහර සිවිල් සමාජ ක්‍රියාකාරීන්, සමහර ජනමාධ්‍ය කියන ඔක්කොමලා අපිට පෙන්නුවේ, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා නවීනත්වයේ ප්‍රතිමූර්තිය හැටියට. ඇමෙරිකාවේ ඉඳලා ආපු, නවීන සමාජයක් දකින කෙනා හැටියට; සරල කෙනෙක් හැටියට; දුරදකින කෙනෙක් හැටියට. දේවල් බොහොම හොඳට සැලැසුම් කරලා කරන්න පුළුවන් කෙනෙක් හැටියටයි අපිට පෙන්නුවේ. හැබැයි, ආවාට පස්සේ දැන් අපට පේන්න පටන් ගත්තා, ඒක එහෙම නොවෙයි කියලා. දොරටුපාල රජ වුණා වගේම තමයි. රජකම හුරු නැහැ කියලා පේනවා. අර කියපු කතා එකක්වත් සිද්ධ වෙන්නේ නැහැ. දැන් තියෙන්නේ ඉතාමත් සරල රංගනයක්. බාල වර්ගයේ ටෙලි නාට්‍යයක් වගේ. පහුගිය දවසකත් අමාත්‍යාංශයකට කඩාපැන්නා කියලා අපි දැක්කා. ජනාධිපතිකම කරන්නේ

නැතිව නිවාස අධිකාරියට යනවා වාගේ වැඩ කරමින් ඉන්නේ. විස්ස ගේන කොටත් අපි දැක්කේ, ඒ තිබුණු නුපුහුණුකම; කලබලකාරීත්වය.

මගේ අතේ මේ තියෙන්නේ, විසිවැනි සංශෝධනයේ කෙටුම්පත. මේක මුද්‍රණය කරලා තියෙන්නේ, අගෝස්තු මාසයේ විසිඅට වැනිදා. නිකුත් කළේ සැප්තැම්බර් මාසයේ දෙවැනිදා. මේක සිද්ධ වුණේ කොහොම ද? අගෝස්තු මාසේ විසිඅටවැනිදා වෙන කොට මේක හදලා, ගැසට් කරන්න මුද්‍රණාලයට යැව්වා. සැප්තැම්බර් මාසේ පළමුවැනිදා උපදෙස් ගන්න නීතිපතිට යැව්වා. සැප්තැම්බර් මාසේ දෙවැනිදා ඇමති මණ්ඩලය රැස් කරලා, හදිසි පනතක් හැටියට ඇමති මණ්ඩලයට ඉදිරිපත් කරලා, එවෙලේම සම්මත කරලා එළියට දැම්මා. දවස් දෙක තුනකින් සම්පූර්ණ වැඩේම ඉවර කළා. ඒ නිසා මේක බොහොම කලබලයට ගෙනාපු එකක්.

## කම්ටු නාටකය

සාමාන්‍යයෙන් වැදගත් කෙටුම්පතක් අධ්‍යයනය කරන්න, ඇමති මණ්ඩලයට දාලා සම්මත කර ගන්නකල් සතියකවත් කාලයක් දෙනවා. මේක එහෙම නොවෙයි. එවෙලෙම කියෙව්වා, එවෙලම සම්මත කර ගත්තා. මේක කියෙව්වේ, අලි සබ්‍රි මහත්තයා කියලයි කියන්නේ. අහගෙන හිටපු උදවියට තේරුණාද දන්නෙත් නැහැ. ඔක්කොටම අතඋස්සන්න කිවුවා, ඔක්කොමලා අත් ඉස්සුවා. හැබැයි, අත් උස්සලා, මේක එළියට දැම්මාට පස්සේ සමාජයෙන් ලොකු විරෝධයක් ආවා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට සහතික දිදී, ඡන්දය දීපු අය පවා මේකෙන් තිගැස්සුණා. මේ ජාතියේ එකක් ඒ ගොල්ලන්ගේ ඔළු මතට කඩාවැටෙයි කියලා ඒ ගොල්ලෝ හිතුවේ නැහැ. වඩා යහපත් පාලනයක් වෙනුවෙන් හැටනව ලක්ෂයක් ඡන්දය දුන්නානේ. ඒ ගොල්ලන්ටත් මේක දිරවා ගන්න ටිකක් අමාරු නිසා පොඩි පොඩි විරෝධතාවන් එන්න පටන් ගත්තා. එතකොට ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජනාධිපති කරවන්න දරදිය ඇද්ද උදවියටත් මේකේ අඩුපාඩුකම් කියන්න සිද්ධ වුණා. මොකද? ඒ ගොල්ලන්ගේ ආත්මය බේරා ගන්න. ආත්මගෞරවය බේරා ගන්න නොවෙයි. ඒ ගොල්ලන්ට ආත්මගෞරවයක් නැහැ. ආත්මය බේරා ගන්න එක එක ඒවා කියන්න සිද්ධ වුණා.

ඒ අතුරින් දෙක තුනක් ගත්තොත්, මෙහෙම තියෙනවා, "විස්සෙන් ජනාධිපතිට මුක්තිය දීම, විගණකාධිපතිගේ බලතල අඩු කිරීම බරපතළ වරදක්." - බෙංගමුවේ නාලක හාමුදුරුවෝ කියන්නේ. ඊ ළඟට මැඩිල්ලේ පඤ්ඤාලෝක හාමුදුරුවෝ කියන්නේ, "මහින්ද රාජපක්ෂ මහත්තයාට තියෙන දේශපාලන මොළය ගෝඨාභයට නැහැ" කියලා. මේ බව කලින් කිවුවා නම්, ප්‍රශ්න ගොඩක් විසඳෙනවා. බෙංගමුවේ නාලක හාමුදුරුවෝ කියන්නේ, "අපි ආණ්ඩුව ගෙනාපු එක ඇත්ත. ඒත්, විස්සේ ඇති ඇතැම් කොටස්වලට අපි විරුද්ධයි" කියලා. ඒ අස්සේ විමල් වීරවංශ මහත්තයා, "විසිවැනි සංශෝධනයේ බරපතළ ගැටලු රැසක් තියෙනවා" කියලා කියනවා. නව ගැසට් පත්‍රයක් පාර්ලිමේන්තුවට එනවා කියලත් කියනවා. මේ වාගේ කතා ගොඩක් තිබුණා. වීරවංශ මහත්තයලා, ගම්මන්පිල මහත්තයලා මේ වාගේ කතා කියන්නේ, කැබිනට් මණ්ඩලයේදී විස්සට අත උස්සලා ඇවිල්ලා. පොදුවේ ගත්තාම ඒ ගොල්ලෝ මතයක් හැදුවා, විස්සේ ගැටලු ගොඩක් තියෙනවා කියලා. ඊට පස්සේ විස්ස පිළිබඳව අධ්‍යයනය කරන්න අගමැතිතුමා කමිටුවක් පත් කළා. මේ නාට්‍යයේ එක එක කොටස් මම මේ කියන්නේ.

ඒ කමිටුවේ හිටියේ කවුද? ජී.එල්. පීරිස්, උදය ගම්මන්පිල, අලි සබ්‍රි, නිමල් සිරිපාල, විමල් වීරවංශ මේ පස්දෙනාම කැබිනට් ඇමතිවරු. ඊට පස්සේ සුසිල් ප්‍රේමජයන්ත, විලේන්ද්‍රන්, ඩිලාන් පෙරේරා, ප්‍රේමනාත් දොළවත්ත කියන රාජ්‍ය ඇමතිවරුන් සහ මන්ත්‍රීවරුන් හිටියා. මේ නවදෙනාගෙන් පස්දෙනෙක් කැබිනට් ඇමතිවරු. විස්සේ අඩුපාඩුකම් හොයන කමිටුව පත් කරන්නේ අගමැතිතුමා. හැබැයි මේ අඩුපාඩුකම් හොයන කට්ටිය ඒ අඩුපාඩුකම් හොයන්නේ, ඇමති මණ්ඩලයේදී 20ට අත් උස්සලා ඇවිල්ලා. එතකොට එක්කෝ ඒ ගොල්ලන්ගේ දැනුම පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. නැත්නම්, හෘදයසාක්ෂිය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. එහෙම නැත්නම්, අත් උස්සලා ඇවිල්ලා, ලැජ්ජාව වහ ගන්න කියන කතාන්දරයක් තියෙනවා. ඒ නිසා මේ මුළු ක්‍රියාවලියම අර්බුදකාරී එකක්; අපැහැදිලි එකක්. කැබිනට් මණ්ඩලයේදී විස්ස සම්මත කළා නම්, ඒ සම්මත කළ කට්ටියම ආයේ අඩුපාඩුකම් හොයන්නේ මොකට ද? අඩුපාඩුකම් හොයනවා නම්, හොයන්න තිබුණේ, කැබිනට් මණ්ඩලයේදී සම්මත කර ගන්න කලින්. සම්මත කරලා

ඇවිල්ලා, අඩුපාඩුකම් හොයන කමිටුවක් මොකටද? එතනයි ගැටලුව තියෙන්නේ. ඊට පස්සේ කිවුවේ, මේ විස්ස නොවෙයි, අලුත් විස්සක් ගේනවා කියලා.

## සැඟවුණු අයිතිකරු

ඒ අස්සේ විස්සේ අයිතිකාරයා පිළිබඳ ප්‍රශ්නයත් ආවා. විස්ස ඉදිරිපත් කරපු අලි සබ්‍රි මහත්තයාගෙන් ඇහැව්වාට පස්සේ අධිකරණ ඇමති විදියට ඒක ඉදිරිපත් කළාට ඒක හැදුවේ එයා නොවෙයි කීවා. වීරවංශ මහත්තයා දන්නෙත් නැහැ කියලා කිවුවා. එහෙම ගත්තාම මේකේ අයිතිකාරයෙක් නැහැ වගේ පේන්න පටන් ගත්තා.

අයිතිකාරයෙක් නැහැ නොවෙයි, අයිතිකාරයා භය වුණා තමන්ගේ අයිතිය කියන්න. මොකද? අයිතිය කියන්න තරම්වත් බැරි එකක් මේක. ඒ නිසා අයිතිකාරයෝ ඉන්නවා, හැබැයි අයිතිය කියන්නේ නැහැ. අපේ රටේ එහෙම ඒවා ගොඩක් තිබුණා. මල්වානේ ගෙයක් තිබුණා, ඒකේ අයිතිකාරයෙක් නැහැ. දෙහිවල පැත්තේ ඉඩම් තිබුණා, අයිතිකාරයෝ අයිතිය කිවුවේ නැහැ. මාතර පැත්තෙත් ඉඩමක් තිබුණා, අයිතිකාරයෝ අයිතිය කිවුවේ නැහැ. මැණික් මල්ලක් ගැන කතාවකුත් තිබුණා. ඔය වාගේ සුරංගනා කතා ගොඩක් ආයෙත් ඇවිල්ලා. හැබැයි, මේකේ අයිතිකාරයා නොකිවුවාට අපි දන්නවා අයිතිකාරයා ගැන. ඇත්ත ගත්තොත්, මේකේ ඉස්සරහින් ඉන්න අයිතිකාරයා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා. පිටිපස්සෙන් ඉන්න අයිතිකාරයා, එක්සත් ජනපද අධිරාජ්‍යවාදීන්. මේ බව කාට හැංගුවත්, අපට හංගන්න බැහැ. මේ විස්සෙන් ප්‍රතිඵල ලැබෙන්නේ කාටද? විස්ස කාගෙද කියලා හොයා ගන්න නම්, විස්ස කාටද කියන එක බලන්න ඕනෑ. කල්පනා කරලා බලන්න. විස්ස ජනතාවටද? නැහැ. විසිවැනි සංශෝධනයෙන් ජනතාවට මොකක්වත් හම්බ වෙන්නේ නැහැ. විස්ස පාර්ලිමේන්තුව සඳහාද? ඒත් නැහැ. පාර්ලිමේන්තුවට මොකක්වත් හම්බ වෙන්නේ නැහැ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුවේ තියෙන බලතල ටිකත් උදුරා ගන්නවා. විස්ස ඇමති මණ්ඩලයටද? ඒත් නැහැ. ඇමති මණ්ඩලය රෑකඩ කරනවා. විස්ස අගමැතිටත් නොවෙයි. අගමැතිවත් අර පරණ සීල්

එක බවට පත් කරනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා ජනාධිපති වෙලා හිටිය කාලේ දි.මු. ජයරත්න මහත්තයා අගමැති වෙලා හිටියා වාගේ. මහින්ද රාජපක්ෂ මහත්තයත් ඔය තත්වයට පත් වෙනවා. එහෙනම්, විස්ස බැලූබැල්මට කාටද? ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට.

එයා තමයි, විස්සේ අයිතිකාරයා. එයාට මොකටද විස්සක්? එයාගේ හාම්පුතාලගේ, ඒ කියන්නේ අධිරාජ්‍යවාදීන්ට ඕනෑ දේවල් මේ රටේ කරන්න. ඒකට තමයි, එයාට විස්සක් ඕනෑ. ඒ නිසා විස්සේ මූලික අයිතිකාරයා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා. පිටිපස්සේ ඉන්න අයිතිකාරයා, අධිරාජ්‍යවාදීන් කියන එක අපි හොඳින්ම දන්නවා. ඒක කොච්චර හංගන්න උත්සාහ කළත්, ඒක අපිට හංගන්න බැහැ. මේ ගෙනැත් තියෙන්නේ, ඒ විස්ස. මේ සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ඉන්න අය සහ මේ ආණ්ඩුව හදන්න උදවු කළ අයගේ විරෝධය අපි නම්, ගණන් ගන්න ඕනෑ නැහැ. ඒ විරෝධයෙන් කිසි ප්‍රතිඵලයක් එන්නේ නැහැ. ඇත්තටම කිවුවොත්, විරෝධයක් නොවෙයි මේ පොඩි කෙඳිරිගෑමක් කරන්නේ. සමාජයට මුහුණ දී ගන්න බැරි නිසා අපිත් මොකක් හරි කෙරුවයි කියන්න කරන දෙයක් මිස විරෝධය පළ කරන්න ඒ ගොල්ලන්ට බැහැ. මොකද? විස්ස ගේන්න කලින්ම ඒ ගොල්ලන්ව මේකෙ වහල්ලු කරලා තියෙන්නේ; රූකඩ බවට පත් කරලා තියෙන්නේ. ඔය කාටවත් කටක් ඇරලා නරකයි කියන්න බැහැ. විස්සේ ගැටලු ගොඩක් තියෙනවා කියලා, වීරවංශ මහත්තයා කියනවා නේ. නමුත්, ඇමති මණ්ඩලයේදී මොනවා හරි කියනවාද? එහෙම නැහැ. ඇමති මණ්ඩලයෙදී කරබාගෙන ඉඳලා, එළියට ඇවිල්ලා මොකක් හරි කියනවා. ඒ නිසා ජනමාධ්‍යවලට කියන කතා මිසක් මේවා ආණ්ඩුවට කියන කතා නොවෙයි. තමන්ගේ ආත්මය බේරා ගන්න කියන කතා මිසක් ඇත්තටම විස්සට විරුද්ධ නිසා කියන කතා නොවෙයි. ඒ නිසා මේ ආණ්ඩුව හදන්න දායක වුණු සහ ආණ්ඩුව ඇතුළේ ඉන්න අය විස්ස ගැන කරන කෙඳිරිගෑම්වලින් ජනතාව නොමඟ යා යුතු නැහැ කියලා අපි කියනවා.

## කැමැත්ත පැරදවීම

ඒ නිසයි අපි කියන්නේ, විස්ස පිළිබඳව ජනතාව ගැඹුරින් හොයන්න ඕනෑ කියලා. විස්ස පරද්දන්න ඕනෑ. පාර්ලිමේන්තුවේදී නැත් නම්, කොහොම හරි පරද්දන්න ඕනෑ. විස්ස විතරක් නොවෙයි, පරද්දන්න තියෙන්නේ. මේ ව්‍යවස්ථාවම. ඇත්ත ගත්තොත්, ප්‍රජාතන්ත්‍රවාදය අහිමි කරන ව්‍යවස්ථාවක් අපේ රටේ තියෙනවා. ඒ ව්‍යවස්ථාව වෙනස් කරන්නයි ඕනෑ. ඒ සම්බන්ධයෙන් කතා ගොඩක් තිබුණා. මේ ගොල්ලොත් කිවුවා, අලුත් එකක් හදනවා කියලා. හැබැයි, අලුත් එක හදන්න යන්නේ කොහොම ද කියලා හිතාගන්න පුළුවන්. 20 දිහා බැලුවම සංශෝධනය මෙහෙම නම්, හදන අලුත් ව්‍යවස්ථාව කොහොම තියෙයි ද? මේ ගොල්ලෝ සංශෝධනයක් ගෙනාවත්, අලුතෙන් ව්‍යවස්ථාවක් හැදුවත් ජනතාවාදී ව්‍යවස්ථාවක් හදන්නේ නැහැ. අර්බුදයට ගිය තත්වයක් තුළ රට පාලනය කරන ධනපති පාලකයන්ට, අතීතයේ ජීවත් වෙන මිනිස්සුන්ට, රාජාණ්ඩුවල ජීවත් වෙන මිනිස්සුන්ට, ගෝත්‍රික නායකයන් වගේ හිතන මිනිස්සුන්ට, පාලකයන්ට ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යවස්ථා හදන්න බැහැ. ජනතාවාදී ව්‍යවස්ථා හදන්න බැහැ. ඔවුන් ජීවත් වෙන්නේ අතීතයේ. ඒ ගොල්ලෝ අයිති අතීතයට. අඩුම ගාණේ අනාගතයට තියා වර්තමානයට හදන්නවත් බැහැ. ඒ නිසා අපේ රටේ ජනතාවට කවදා හෝ දවසක ව්‍යවස්ථාවක් හදන්න වෙනවා. අපි හිතනවා, ඉක්මනින් වෙනවා නම්, හොඳයි කියලා.

අපි හදන්න ඕනෑ මොන වාගේ ව්‍යවස්ථාවක්ද? අපේ රටේ ජීවත් වෙන සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ ජාතිකත්වය වාගේම සියලු ආගම් අදහන ජනතාවගේ අනෙක් පැත්තෙන් ස්ත්‍රී, පුරුෂ වෙනසක් නැතිව හැම දෙනාගේම අයිතිවාසිකම් තහවුරු වෙන, ජනතාවට බලය ලැබෙන, ජනතාවගේ පරමාධිපත්‍යය ඇත්තටම ව්‍යවස්ථාව තුළ තහවුරු වෙන නිරූපණය වෙන ඇත්ත ජනතාවාදී ව්‍යවස්ථාවක් හදන්න ඕනෑ. ඒ සඳහා එවැනි නව සමාජයක් ගොඩනගන්න ඕනෑ. එවැනි සමාජ ක්‍රමයක් සමග ඒක හදන්න ඕනෑ. ව්‍යවස්ථාව කියන්නේ, පැත්තක තියන එකක් නොවෙයි. කඩදාසියක තියන එකක් නොවෙයි. ව්‍යවස්ථාවක් හදන්නේ, ඒ මොහොතේ පවතින නිශ්චිත සමාජ-ආර්ථික ක්‍රමය රකින්න. ව්‍යවස්ථාව

කියන්නේ, රටක මූලික නීතිය. වමේ ව්‍යාපාර හැටියට අපි අහලා තියෙනවා, ධනපති රටවල නීතිය කියන්නේ, පාලකයාගේ කැමැත්ත කියලා. "පාලක පංතියේ කැමැත්ත" නීතිය වන්නේය කියලා අපි අහලා තියෙනවා. ඒ නිසා මේ තියෙන්නේ, ඒ ගොල්ලන්ගේ කැමැත්ත, ඒ ගොල්ලන්ගේ පන්තියේ කැමැත්ත. ඒක ජනතාවගේ කැමැත්ත නොවෙයි. ඒ ගොල්ලෝ හදා ගත්තු ආර්ථිකයක් තියෙනවා. ඒ ගොල්ලෝ පවත්වාගෙන යන ක්‍රමයක් තියෙනවා. අන්න ඒ ක්‍රමයයි, ආර්ථිකයයි පවත්වාගෙන යන්න නීතියක් ඒ ගොල්ලන්ට ඕනෑ. ඒ නිසා ඒ ගොල්ලෝ නීතිය හදන්නේ ඒ ගොල්ලන්ට මිස අපට නොවෙයි. ඒ නීතියෙන් පීඩා විඳින්නේ ජනතාව. ජනතාව පීඩාවට පත් කරන ආර්ථිකයක් තියෙනවා. ඒ වාගේම ජනතාව පීඩාවට පත් කරන නීතියක් හදා ගන්නවා. ඒක තමයි, මේ ගොල්ලන්ගේ ව්‍යවස්ථාව කියන්නේ.

ඒ නිසා අපි පරද්දන්න ඕනෑකම තියෙන්නේ, විස්ස විතරක් නොවෙයි. මේ විස්සයි, කඩමාල්ලක් වෙච්ච ජේ.ආර්.ගේ ව්‍යවස්ථාවයි දෙකම පරද්දන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි, මේ ව්‍යවස්ථාව රකින අසාධාරණ, අයුක්තිසහගත, වැරැදි නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමයත් පරද්දලා, ජනතාවට වගකියන, ජනතාවාදී, ජනතාවට සාධාරණය ඉටු කරන සමාජ ආර්ථික ක්‍රමයක් නිර්මාණය කිරීම තමයි, අපේ වගකීම. ඒ වගකීම ඉටු කිරීම සඳහා කැප වුණු බලවේග අපි එකතු කළ යුතුයි.

## මිලේච්ඡත්වය කරා...

විස්සේ වගන්තියෙන් වගන්තිය කියෙවුවාට වැඩක් නැහැ. විස්ස කියවා ගන්න ඕනෑකම තියෙන්නේ, විස්ස ගෙනාපු අයගේ අරමුණුත් එක්ක; අභිලාෂයන් එක්ක. නැත්නම්, කෙනෙක් හිතන්න පුළුවන්, එක් එක් වගන්ති වෙනස් කළාම හරියයි කියලා. ඉස්පිල්ලක් දැම්මාම හරියයි, පාපිල්ලක් දැම්මාම හරියයි කියලා හිතන්න පුළුවන්. විස්සට ඉස්පිලි, පාපිලි දාලා, හැඩවැඩ කරලා බේරන්න බැහැ. ඇයි? විස්ස ඇතුළේ තියෙන්නේ කෙනෙක්ගේ අභිලාෂය. කාගේද? ගෝඨාභය රාජපක්ෂ ඇතුළු අධිරාජ්‍යවාදී කඳවුරේ අභිලාෂය තියෙන්නේ. ඒ නිසා වාක්‍යයෙන් වාක්‍යය, කැලි කැලි වෙනස් කරලා, විස්ස රෙපයාර් කරලා වැඩක් නැහැ. මොකද මේක ඇතුළේ

තියෙන්නේ විස්ස ගෙනාපු අයගේ තියෙන අභිලාෂය ඒ අභිලාෂය තමයි, මහජන ආයතනවලට වග නොකියන, ජනතාවට වග නොකියන, නීතියට වග නොකියන ප්‍රජාතන්ත්‍රවාදී ආයතනත් එක්ක වැඩ නොකරන, තමන්ට හිතෙන හා තමන්ගේ හාම්පුතා කියන ඕනෑ දෙයක් කරන සහ ඒ සඳහා එන ඕනෑම විරෝධයක් මර්දනය කරන සුපිරි තනි පාලන බලයක් තමයි, විස්සේ අරමුණ. ඒ නිසා මේකේ ඉස්පිලි, පාපිලි කපලා, කොටලා, වෙනස් කරලා හරියන්නේ නැහැ. මේකට සංශෝධන ගේන්න සමහර අය යෝජනා කරනවානේ. කාරක සභා අවස්ථාවේදී යෝජනා ගේන්න සාකච්ඡා කරනවානේ. එහෙම කරන්න බැහැ. 20 නපුරු සර්පයෙක් නම්, ඒ සර්පයා සර්පයාම තමයි. ඒක වෙනස් කරන්න පුළුවන්කමක් නැහැ.

විස්සෙන් කර ගන්න යන්නේ, ධනේශ්වර ආයතනවලින්, නිදහස්, ඊට වග නොකියන බලයක් හදාගන්න. කවුරුවත් හිතන්න එපා පාර්ලිමේන්තුව ඇතුළේ මේ ආයතනවලින් සමාජවාදය පිළිබිඹු වෙනවා කියලා. එහෙම මිත්‍යාවක අපි නැහැ. මේවා ධනේශ්වර ආයතන. හැබැයි, ධනේශ්වර ආයතනවලටවත් වගකියන්න මේ ගොල්ලෝ සූදානම් නැහැ. මේ තියෙන ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සර්ව සම්පූර්ණ සුපිරි එකක් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. ඒකාධිපතිවාදයට වඩා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය හොඳයි. අපි කියන්නේ, ඒකයි. ලෙනින් අපට ඉගැන්වූවා, මේ ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය සීමා කරපු එකක් බව. කලින් තිබුණු රාජාණ්ඩු ක්‍රමයට සාපේක්ෂව මේක හොඳ වුණාට මේක කප්පාදු කරලා, සීමා කරලා තියෙන්නේ. ව්‍යාජයි, කුහකයි, පෝසතුන්ට හොඳයි, දුප්පතුන්ට හොඳ නැහැ. දැන් වෙලා තියෙන්නේ, ඒ සීමා කරපු ප්‍රජාතන්ත්‍රවාදයවත් මේ ගොල්ලන්ට දෙන්න බැරිකම. ඒ තරම් අර්බුදයට ගිහිල්ලා. මේ ගොල්ලෝ ගෝත්‍රික ලක්ෂණ, ම්ලේච්ඡත්වයේ ලක්ෂණ පෙන්වන්න පටන්ගෙන තියෙන්නේ. සමාජයක් යන්නේ ඉස්සරහට. හැබැයි, සමාජයක් ඉස්සරහට යනවා වෙනුවට ඉතිහාසයේ රෝදය ආපස්සට කරකවන්න ගෝඨාභය රාජපක්ෂ මහත්තයලා උත්සාහයක් දරමින් ඉන්නවා.

මානව ඉතිහාසයේ ගමන් මඟ ගැන අපි අහලා තියෙනවා. මුලින්ම මිනිස්සු ගණ හා ගෝත්‍ර හැටියට ජීවත් වුණා. පෞද්ගලික දේපොළ තිබුණේ

නැහැ. දේශපාලනය තිබුණෙත් නැහැ, රජවරු හිටියෙත් නැහැ, ලොකු පාලකයෝ හිටියෙත් නැහැ. කිසියම් විදියක සාමූහික ක්‍රමයක් අතීතයේ තිබුණා. ඊට පස්සේ පෞද්ගලික දේපොළ ඇති වුණා. ඒ ඇති වුණාට පස්සේ සමාජය පන්තිවලට බෙදෙනවා. දේපොළ හිමි පංතිය රාජ්‍ය බලය ගොඩනගා ගන්නවා. දේපොළ අහිමි පංතිය පාගාගෙන පාලනය කිරීම ආරම්භ වෙනවා. නායකයන්, පාලකයන් සහ ජනතාව කියලා දෙපැත්තක් ඇති වෙනවා. මේ අතුරින් පාලකයන් බවට පත් වුණේ, පරම්පරාවෙන් එන රජවරු. ප්‍රජාතන්ත්‍රවාදය තිබුණේ නැහැ. රජවරු බවට පත් වුණු අය ළඟ සියලු බලතල තිබුණා. එල්ලන්න ඕනෑ කාවද? මරන්න ඕනෑ කාවද? නිදහස් කරන්නේ කාවද වාගේ ඔක්කොම තීන්දු ගත්තේ රජා. රජා ළඟ ව්‍යවස්ථාදායක බලය, අධිකරණ බලය, විධායක බලය කියන ඔක්කොම තිබුණා. රජාගේ කැමැත්ත තමයි, නීතිය වුණේ. පස්සේ ධනේශ්වර ක්‍රමයට එන කොට ඒක වෙනස් වෙලා කිසියම් ප්‍රමාණයකට ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ආවා. ධනපති ක්‍රමය තුළත් සූරාකෑම, පංති පීඩනය තිබුණා. ඒත් ඒ අතරෙ මහජනතාවට තමන්ගේ පාලකයන් තෝරා පත් කර ගන්න අවස්ථාව උදා වුණා. ඒ තෝරා පත් කර ගන්නා පාලකයන්ට සීමා පැනෙව්වා. පක්ෂ නිර්මාණය වුණා. දේශපාලනයට සම්බන්ධ වෙන්නත් ජනතාවට අවස්ථාව ලැබුණා. අධිකරණය වෙනම තිබුණා. පාර්ලිමේන්තුව වෙනම තිබුණා. විධායකය වෙනම තිබුණා. එංගලන්තයෙන් අපට ආපු ප්‍රජාතන්ත්‍රවාදයේ මීටත් වඩා නිදහස තිබුණා. 1970ට කලින් ලංකාවේ පාර්ලිමේන්තුවට අමතරව 'සෙනෙට් සභාව' කියලා එකකුත් තිබුණා. පාර්ලිමේන්තුවට ගේන කිසියම් පනතක් ජනතාවට හානිකර නම්, තවත් ප්‍රමාද කරන්නයි, සෙනෙට් සභාව තිබුණේ. මේ සියලුම ආයතන විසින් රැක්කේ ධනපති ක්‍රමයම තමයි. ඒත් රාජාණ්ඩුවලට වඩා ප්‍රජාතන්ත්‍රවාදය ඉදිරි පියවරක් වුණා.

පැරැණි රාජාණ්ඩු ක්‍රමය වෙනස් කරමින්, ධනේශ්වර ක්‍රමය එනවා. ධනේශ්වර ක්‍රමය තුළ ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ ඇති කරනවා. ධනේශ්වර ක්‍රමය අර්බුදයට යන කොට ධනවාදය තුළ ලබාදී තිබුණු ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ හකුළා දමමින් නැවත වරක් පැරැණි රාජාණ්ඩු ක්‍රමය අලුත් ක්‍රමයකට ස්ථාපිත කරන්න පටන් ගන්නවා. දැන් නැත්තේ, රජ ඇඳුම විතරයි. අනික් ඔක්කොම රජ තමයි. රජ මානසිකත්වය, රජ පුටුව, රජ පවුල ඔක්කොම

එහෙම තමයි. අර රජ ඇඳුම වෙනුවට කලිසම ඇඳලා, ෂර්ට් එකක් දාලා ඉන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කිවුව නවීනත්වය නොවෙයි මේ. නවීනත්වය නම්, ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් වෙන්න ඕනෑ. අඩු තරමින් ඇමෙරිකාවෙන් ඉගෙන ගත්තා නම්, ප්‍රජාතන්ත්‍රවාදය මීට වඩා පුළුල් වෙන්න ඕනෑ. මේ තියෙන්නේ රටත් ජනතාවත් පරණ ම්ලේච්ඡත්වයට, පරණ රාජාණ්ඩු ක්‍රමයට ආපහු ඇදගෙන යන එක.

## අපරාධකරුවන්ට ලයිෂන්

විස්ස තුළ තිබෙන ප්‍රධාන කරුණු ගත්තොත්, මේ බව අපට තේරුම් ගන්න පුළුවන්. විස්සෙන් ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරනවා. අහෝසි කරනවා කීවාට අක්‍රිය කර බලරහිත කරනවා. වැඩක් කරන්න බැරි නාමික ආයතනයක් කර තියෙනවා. කලින් තිබුණේ, උදාහරණයක් විදිහට පොලිස්පති, අගවිනිසුරු වගේ සමහර පත්කිරීම් නිර්දේශ කරන්නේ, කොමිෂන් සභාව. ඒ නිර්දේශ කළාට පස්සේ ජනාධිපතිවරයා විසින් පත් කරනවා. හිතුවක්කාරකමට පත් කරන්න බැහැ. දැන් මොකද වෙලා තියෙන්නේ? කොමිෂන් සභාවලට නිරීක්ෂණ ඉදිරිපත් කරන්න පුළුවන්. පත්වීම් කරන්න බැහැ. කොමිෂන් සභාව මොකක් කිවුවත්, ඒවා පැත්තකට දාලා, ජනාධිපතිවරයාට තමන් කැමැති කෙනෙක් පත් කරන්න පුළුවන්. කොමිෂන් සභා අක්‍රිය කරන්නේ මෙහෙම. ඒවා නාමික බවට පත් කරන්නේ ඔය විදියට. ඒ වෙනුවට තනි කෙනකුගේ බලයක් ගොඩනගලා තියෙනවා. අධිකරණයේ අගවිනිසුරුතුමා ඇතුළු විනිසුරු මඬුල්ල පත් කරන්නේ ජනාධිපතිවරයා. එතකොට අධිකරණයේ ස්වාධීනත්වයක් බලාපොරොත්තු වෙන්න පුළුවන්ද? ජනාධිපති ශ්‍රේෂ්ඨාධිකරණයට පත් කරන්නේ, තමන් කැමැති කෙනෙක්. ඒ නිසා ඒ තනතුරට පත් වෙන්න කැමැති කට්ටියට සිද්ධ වෙන්නේ, ජනාධිපති කැමැති තාලයට ජීවත් වෙන්නයි. ජනාධිපති කැමැති කෙනෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුතුමා බවට පත් කරනවා. අනෙක් පැත්තෙන් ඒ තනතුරට යන්න බලාපොරොත්තුවෙන් ඉන්න කවුරුහරි කරන්නේ, ජනාධිපතිගේ කැමැත්ත දිනාගන්න උත්සාහ කරන එක. එතකොට ස්වාධීනත්වයක් නැහැ. මේ අනුව අධිකරණයේ

ස්වාධීනත්වය නිකම්ම පොතේ වචන බවට පත් වෙනවා. විනිසුරුතුමන්ලාට, විනිසුරුතුමියන්ලාට ජනාධිපති සතුටු කරන විදියේ වැඩ කරන්න සිද්ධ වෙනවා. ඒ නිසා අධිකරණයෙන් කිසියම්ම හෝ ස්වාධීනත්වයක් තිබුණා නම්, ඒකත් අහෝසි වෙලා යනවා. මේ ජේ.ආර්. කරපු වැඩේමයි.

පොඩි පොඩි ප්‍රශ්නවලදී අධිකරණය මේ විදියටම තියේවි. නමුත්, දේශපාලන ප්‍රශ්නවලදී ඒ ගොල්ලන්ට ඕනෑ විදියට වැඩ කරන තැනක් බවට පත් කර ගන්නවා. විසිවැනි ව්‍යවස්ථා සංශෝධනයේ අනෙක් බරපතළම දේ ජනාධිපතිට මුක්තිය ලබා දීම. ජනාධිපති ධුරය දරන කාලයේ රාජකාරීමය ලෙස හෝ පෞද්ගලික ලෙස කරන වැරැද්දකට හෝ නොකර හරින ලද වැරැද්දකට නඩු පැවරිය නොහැකිය යන තත්වය ඇති කරනවා. කවුරුහරි කෙනෙක් තමන් උසාවි ගේන්න එපා කියලා නීතියක් හදා ගන්නවා නම්, ඒකෙන් කියන්නේ මොකක්ද? ඒ තැනැත්තා බලාපොරොත්තු වෙනවා අනාගතයේදී වැරැදි කරන්න. කිසියම් ජනාධිපතිවරයකුට "මං කවදාවත් මේ රටට හෝ ජනතාවට වරදක් කරන්නේ නැහැ කියලා අධිෂ්ඨානයක් තියෙනවා නම්, මේ නීතිය මෙහෙම වෙනස් කරන්න ඕනැ නැහැ. නමුත්, මේ නීතිය වෙනස් කරන්නේ ඇයි? ඒවා දාන කොටම ඒ අයගේ අභිලාෂය කියවෙනවා. වැරදි කරන්න වෙනවා, අපරාධ කරන්න වෙනවා කියන එකයි ඒ තියෙන්නේ. ඒ අපරාධවලට දඬුවම් විඳීමට සිදුවීමෙන් ගැලවෙන්න 'ගාඩ්' එකක් දාගන්නවා. ඒ නිසා මතක තියා ගන්න මේ වගන්තිය අපරාධකරුවන්ට 'ලයිෂන්' දීමේ වගන්තියක්. රටේ පළමු පුරවැසියාට භය නැතුව අපරාධ කරන්න පුළුවන් 'ලයිෂන්' එකක් තමයි, මේ ගන්න යන්නේ. පාර්ලිමේන්තුවේ ඉන්න ඒ ගොල්ලන්ගේ සෙට් එක අත් උස්සලා දෙන්න හදන්නේ ඒ අයිතිය. අපරාධ කිරීමේ අයිතිය ලයිෂන් එකකින් ජනාධිපතිට අරන් දීම.

ඊළඟට විගණන කොමිසම දුර්වල කරලා තියෙන්නේ. කොමිසම තියෙනවා, හැබැයි, දුර්වලයි. ඒ වාගේම අගමැති කාර්යාලයයි, ජනාධිපති කාර්යාලයයි විගණනය කිරීම තහනම්. ඒ දෙකේ තමයි, වැඩිපුරම ඔය ගනුදෙනු සිද්ධ කෙරෙන්නේ. ඒ වාගේම රාජ්‍ය සමාගම් විශාල ප්‍රමාණයක් රජයේ විගණනයෙන් අයින් කරලා. ඒ අතර 'මිහින් ලංකා'ත් තියෙනවා,

'රක්නා ලංකා'ත් තියෙනවා. ගුවන්තොටුපළ සහ ගුවන්සේවා සමාගමත් තියෙනවා. මේ කියන්නේ, පහුගිය කාලයේ වැඩිපුරම ගසාකෑව තැන් විගණනයෙන් අයින් කරලා. තමන් ඉන්න තැන් විගණනයෙන් අයින් කරනවා කියන්නේ, හොරකම් කරන්න අපිට ඉඩ දීපන් කියලයි. ඕනෑම ආයතනයක විගණනයෙන් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? සමහර ගෙවල්වලත් විගණනයක් තියෙනවා. මාසේ අන්තිමට බලනවා, තමන්ගේ ආදායම් වියදම් වුණේ කොහොම ද කියලා. ඒ ගැන නෝනායි, මහත්තයායි සමාලෝචනයක් කරනවා. පුංචි වැටුපක් ගන්න කට්ටිය එහෙම කරනවා නම්, බිලියන ගණන්වලින් සල්ලි හුවමාරු කරන තැන්වල විගණනය එපා කියන්නේ ඇයි? "මගේ තැන විගණනය කරන්න එපා" කියන්න පුළුවන් වෙන්නේ, හොරෙකුට විතරයි. හොරකම් කරන්න ආශාවෙන් ඉන්න කෙනකුට විතරයි. ඒ නිසා මේ මඟින් කරන්නේ හොරකම් කරන්නත් 'ලයිෂන්' දෙන එක. විස්සෙන් විගණන කොමිසම අයින් කරන්නේ, අගමැතිලාට, ජනාධිපතිලාට හොරකම් කරන්න 'ලයිෂන්' දෙන එක. "අපි හොරකම් කරනවා, උඹලා ඒවා හොයන්න එන්න එපා..." කියන එක. එක පැත්තකින් අපරාධ කරන්න 'ලයිෂන්' ගන්නවා. අනෙක් පැත්තෙන් හොරකම් කරන්නත් ලයිෂන් ගන්නවා. විස්සට දීලා බලමු මොකද වෙන්නේ කියලා. දැනටමත් අත් උස්සන්න කට්ටියක් ඉන්නවා.

## දෙබිඩ්ඩන් මැති සභයට

තවත් පැත්තකින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය නැවත ජනාධිපති අරන් තියෙනවා. අවුරුද්දකින් පස්සේ පාර්ලිමේන්තුව විසුරුවා හරින්න පුළුවන්. ඒ කියන්නේ මොකක්ද? මන්ත්‍රීවරුන්ගේ බෙල්ලෙන් අල්ලලා තියෙන්නේ. මන්ත්‍රීවරුන්ට සද්ද බද්ද දාන්න බැහැ. එහෙම ගියොත් එහෙම අවුරුද්දකින් පස්සේ ජනාධිපතිට පුළුවන් පාර්ලිමේන්තුව විසුරුවා හරින්න. එතකොට ආපහු ඡන්දවලට යන්න නොමිනේෂන් හම්බ වෙයිද දන්නෙත් නැහැ. ඒවාට බයයි. අඩුම ගාණේ අවුරුදු පහක් ඉඳලා පෙන්ෂන් එක හදා ගන්නයි මන්ත්‍රීවරු බලන්නේ. ඒ නිසා අවුරුදු පහ යනකම් සද්ද නැතිව ඉන්න රූකඩ බවට පත් වුණු මන්ත්‍රීවරු සෙට් එකක්ම ඉන්නවා.

ඕක ජේ.ආර්. වෙන විදියකට කළා. හයෙන් පහක බලයක් තිබ්බ එදා කළේ එයාගේ පක්ෂයේ සියලු මන්ත්‍රීවරුන්ගෙන් දින නැති ඉල්ලා අස්වීමේ ලියුමක් අර ගත්ත එක. ඊට පස්සේ ඒ ගොල්ලන්ට කතා කරන්න බැහැ. විරුද්ධව කතා කළොත් එහෙම දිනය දාලා පාර්ලිමේන්තු මහ ලේකම්ට යවලා ගෙදර යවනවා. ඊට අමතරව පාර්ලිමේන්තුව විසිරවීමේ බලයත් ජේ.ආර්. තියාගෙන හිටියා. දැන් මේ මහජනතාවගේ ඊනියා පරමාධිපත්‍ය බලය ගැන කතා කරනවානේ. ආණ්ඩුවක් හදන්න ඡන්දදායකයා ඡන්දය දෙන්නේ මන්ත්‍රීවරුන්ට. ජනාධිපතිත් ඡන්දයෙන් තමයි. හැබැයි, ජනාධිපති පාර්ලිමේන්තුව පත් කරන්නේ නැහැ. ජනතාවගේ ඡන්දයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පත් වෙන්නේ අවුරුදු පහකට. 20 මගින් ඒ මහජනතාවගේ පරමාධිපත්‍ය බලය ජනාධිපතිගේ අතට ගන්නවා. එහෙම අරගෙන "උඹලාව අවුරුදු කීයකට පත් කළත්, මට ඕනෑ නම්, අවුරුද්දකට පස්සේ ගෙදර යවන්න පුළුවන්" කියන කොට කවුරුවත් විරුද්ධ වෙන්නේ නැහැ. මේකෙන් වෙන්නේ පාර්ලිමේන්තුව රූකඩයක් බවට පත් කර ගැනීම.

විස්සෙන් අධිකරණයේ ස්වාධීනත්වයට අත තියලා තියෙනවා. ව්‍යවස්ථාදායකය වන පාර්ලිමේන්තුව රූකඩයක් බවට පත් කරලා තියෙනවා. හොරකම් කිරීම සඳහා වෙච්ච ලයිෂන් එක අරගෙන තියෙනවා. අපරාධ කිරීම සඳහා ලයිෂන් එක අරන් තියෙනවා. පාලකයෙක් අත මේ ටික ඔක්කොම තිබුණාම ජනතාවට වෙන්නේ මොකක්ද? අපි අහන්නේ ඒකයි. අපි මේ බව දැන හිටියා. ඒ නිසා අපිට දුකක් නැහැ. නමුත්, රැවටිලා ඡන්දය දීපු ලක්ෂ හැටනවයක් ඉන්නවා. විනයගරුක රටක් හදනවා, නීතිය සැමට සාධාරණව ඉෂ්ට කරනවා වාගේ සුරංගනා කතා ගොඩක් ගෝඨාභය රාජපක්ෂ මහත්තයලා කිවුවා. සුරංගනා කතා අපට ඇති තරම් පෙන්නුවා. දැන් මොකද වෙන්න යන්නේ? 20 තියෙන මේ ටික සම්මත වුණත්, රටේ තත්වය ඉතාම බරපතළයි. ඒ අතර ද්විත්ව පුරවැසිභාවය තියෙන අයට පාර්ලිමේන්තු එන්න පුළුවන් සංශෝධනත් ඇතුළත් කරලා. අපේ වගේ රටක අය ද්විත්ව පුරවැසිභාවය තියාගෙන පාර්ලිමේන්තුවට එන්නේ මොකට ද? අපේ රටේ පාර්ලිමේන්තුවට පත් වෙන්න ඕනෑ අපේ රටේ මිනිස්සුනේ. මෙතැන ඉන්න කාටවත් ඔය ද්විත්ව පුරවැසිභාවය තියෙනවාද? අපි කාටවත් එහෙම ප්‍රශ්නයක් නැහැ. මේක එන්නේ, කකුල්

දෙක දෙපැත්තේ තියාගෙන ඉන්න අයට. එහෙත් ඉන්න, මෙහෙත් ඉන්න අයට. මෙහෙන් හොරකම් කරලා, එහෙට සල්ලි කීයක් හරි දානවා. හදිසියක් වුණොත් එහෙම, මේක අත්හැරලා එහෙට පනිනවා. එහෙත් පුරවැසිකම තියාගෙන, මෙහෙත් පුරවැසිකම තියාගෙන බලය අරගෙන මෙහෙ හොරකම් කරලා එහෙට ගිහින් දානවා. මෙතැන ප්‍රශ්නයක් වෙන කොට රටින් පැන්නාම අල්ලලත් ඉවරයි.

ඒ නිසා ද්විත්ව පුරවැසියන් සම්බන්ධ ප්‍රශ්නය ඉතා බරපතළයි. සමහරු කියනවානේ මේක පුද්ගලයෙක් දිහා බලලා විරුද්ධ වෙනවා කියලා. නැහැ ඒක එහෙම නොවෙයි. මේක අනුව ගත්තොත් එහෙම, වෙන රටක කෙනකුට සල්ලි තියෙනවා නම්, ලංකාවේ පුරවැසිභාවය ගන්න පුළුවන්. එතකොට අපේ රටට ඇවිල්ලා, ඇමතිවරු වෙන්නත් පුළුවන්. අගමැති වෙන්නත් පුළුවන්. ජනාධිපති වෙන්නත් පුළුවන්. එහෙම වෙලා රට සූරාගෙන කන්නත් පුළුවන්. ඒ ගොල්ලන්ට මෙහෙ කට්ටිය ඉන්න නිසා එච්චර මහන්සි වෙන්න ඕනැ නැහැ. මේ වාගේ බරපතළ ප්‍රශ්න අපේ රටේ ජනතාව ගැඹුරින් තේරුම් ගන්න ඕනෑ කියලයි අපි අවධාරණය කරන්නේ.

## සිග්නල් කණු

මේ වෙන කොට දහනවය සහ විස්ස පිළිබඳව කතාවක් යනවානේ. 19 අඩුපාඩු තියෙන නිසා ඒක නිවැරදි කරගන්න 20 ඕනෑ කියනවානේ. දහනවය හදන කොට සමාජ බලවේග අතරේ ලොකු ඉල්ලුමක් තිබුණා, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. 2015 ආණ්ඩුව හදන කොට එකතු වුණු සමාජ බලවේග වාගේම ඡන්දය දීපු ජනතාව අතරත් විශාල ඉල්ලුමක් තිබුණේ, විධායක ජනාධිපති ධුරය අහෝසි කරන්නයි. සෝභිත හාමුදුරුවන්ගේ 'සාධාරණ සමාජයක්' සංවිධානය පිහිටෙව්වෙත් ඒකට. මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරණ අපේක්ෂකයා වුණේ, දහනවය ගේන්න නොවෙයි; විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න. නිදහස් චතුරස්‍රයේදී මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයා දිවුරුම් දෙන අවස්ථාවේ කිවුවේ මොකක්ද? ලංකාවේ අවසාන විධායක ජනාධිපතිවරයා තමා බවයි. මේ රටේ විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ සටනක් තිබුණා. ඒ

සටනේ පෙරමුණේම හිටියේ ජනතා විමුක්ති පෙරමුණ. 1978 සිටම විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ සටනේ අපි අඛණ්ඩව ඉන්නවා; අදත් ඉන්නවා; හෙටත් ඉන්නවා. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන තුරු ඒ සටනේ අපි ඉන්නවා. හැබැයි, 2015 දුර්වල ආණ්ඩුවක් තිබුණා. ඒකට විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න පුළුවන්කමක් තිබුණෙත් නැහැ. ඒ වාගේම කැමැත්තක් තිබුණෙත් නැහැ. ඒ නිසා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන තුරු ඒ සඳහා තබන ආරම්භක පියවරක් හැටියට දහනව වැනි සංශෝධනය ගෙනැල්ලා විධායක ජනාධිපති ධුරයේ බලතල ටිකක් අඩු කළා. නමුත්, කළ යුතුව තිබෙන්නේ, සමස්ත විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන එක. ඒ වෙලාවේ ඒක කර ගන්න බැරි නිසා පස්සේ කර ගමු කියලා ජනාධිපතිගේ බලතල ටිකක් අඩු කළා.

මෛත්‍රීපාල සිරිසේන මහත්තයා පොරොන්දු වුණා, ආරම්භයේදීම විධායක ජනාධිපති බලතල ටිකක් අඩු කරලා, ඉතිරි ටිකත් සම්පූර්ණයෙන්ම අයින් කරනවා කියලා. 19 අඩුපාඩුකම් තියෙන එක ඇත්ත. ඒ අඩුපාඩුකම් අපි හදපුවා නොවෙයි. 19 ගේන වෙලාවේ ඒ ගොල්ලො කොච්චර කැපුවාද? ජනාධිපතිවරයා ටිකක් කැපුවා. අගමැති තව ටිකක් කැපුවා. ඊට පස්සේ දිනේෂ් මැදිහත් වෙලා තව ටිකක් කැපුවා. ඒ ගොල්ලෝ ඔක්කොම එකතු වෙලා ටික ටික කපලා, අන්තිමට ගෙනාවේ අංගවිකල එකක්. හැබැයි, ඒක එහෙම වුණත්, කිසියම් ප්‍රමාණයකට ප්‍රජාතන්ත්‍රවාදය ගෙනාවා. දැන් කරලා තියෙන්නේ, ඒක ආපහු පරණ තැනටත් එහා ගෙනියන්න සූදානමක්. දහනවය 'අප්සෙට්' නිසා විස්ස ගෙනාවා නොවෙයි. දහනවයේ අඩුපාඩුකම් තියෙනවා නම්, ගේන්න ඕනෑ ඒ අඩුපාඩුකම් සම්පූර්ණ කරන විස්සක්. ඒ කියන්නේ, විස්ස යනු විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ යෝජනාවක්. ඒ නිසා තමයි, ජනතා විමුක්ති පෙරමුණේ අපි විසිවැනි සංශෝධන යෝජනාව ගෙනාවේ. ඒක තමයි, ඇත්ත විස්ස. ගේන්න ඕනෑ විස්ස ඒක. හැබැයි, මේ කරන්නේ ඒ විස්ස වෙනුවට දහනවයට පස්සේ විස්ස කියන නම දාලා, දහඅටට ආපහු යන එක. මේ ආපහු යන්නේ කලින් එකට. ඒ නිසා කවුරුවත් විස්ස පටලවා ගන්න එපා. කට්ටිය අත් උස්සන්න බලාගෙන ඉන්නේ, ඒ විස්සට. අපේ නලින්ද සහෝදරයා කිවුවා වාගේ අපේ පාර්ලිමේන්තුව අමුතු එකක්. ඒකේ ඉන්න අයට හෘදයසාක්ෂියක් නැහැ.

දියවන්නාවේ ගේට්ටුවෙන් ඇතුළු වෙන කොට ඒවා ගලවලා තියෙන්නේ.

මට මතකයි, සෝවියට් ලේඛක චිංගීස් අයිත්මාතව් ලියපු නවකතාවක්. ඒකේ නම "සියවසක් පවත්නා දවස" එක්තරා ඈත කාලයක කසකස්ථානයේ මැන්කට්වරු කියලා මිනිස්සු වගයක් හැදුවාලු. මනුස්සයෙක් අල්ලාගෙන ඇවිල්ලා, එයාගේ ඔළුවට ඔටු හමක් බැඳලා, දවස් ගාණක් අව්වේ තියලා, එයාගේ මොළයේ ක්‍රියාකාරීත්වය නැති කරනවා. ඊට පස්සේ හිතන්නේ නැති මිනිහෙක් හැදෙනවා. කල්පනා කරන්නේ නැහැ. හාම්පුතා අණ දුන්නාම කරනවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්නෙත් අන්න ඒ මැන්කට්වරු වාගේම ජාතියේ සෙට් එකක්. කල්පනා කරන්නේ නැහැ. හිතන්නේ නැහැ. තර්ක කරන්නේ නැහැ. අණ දුන්නාම ඊට අනුව ඔහේ වැඩ කරනවා. "අත් ඔසවාන්..." කිවුවාම ඔක්කොමලා ඔසවනවා. මේ කණ්ඩායම අතරේ හැත්තෑ අටේ දීත් අත ඔසවපු හාදයෙක් ඉන්නවාද කියලා මම හොයලා බැලුවා. එහෙම කෙනෙක් නම්, හිටියේ නැහැ. පහුගිය කාලයේ ආපු හැම සංශෝධනයකටම මේ කට්ටිය අත් උස්සලා ඉන්නේ. චන්ද්‍රිකාගේ කාලයේ අපි දහහත් වැනි සංශෝධනය ගේන කොට අත් ඉස්සුවා. ඒ පිරිසම ආපහු මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පැත්තෙන් දහඅට ගෙනාවාම ඒකටත් අත් ඉස්සුවා. ඊටත් වඩා නරකම, විහිළුම දේ තමයි, දහඅටට අත් උස්සපු කට්ටිය දහනවය ගෙනාවාම ඒකටත් අත් ඉස්සුවා. ඒ කාලේ අත් උස්සන කොට දහඅටේ හොඳ කිවුවා. දහනවය ගෙනාවාම ඒකටත් අත් ඉස්සුවා, හොඳ කිවුවා. දැන් විස්ස ගෙනාවාම ඒකටත් අත් උස්සන්න බලාගෙන ඉන්නවා. තමන්ට විරුද්ධව තමන් අත උස්සනවා. දහහතට අත උස්සපු මිනිහා දහඅටට අත උස්සනවා කියන්නේ, තමන්ට විරුද්ධව තමන් අත උස්සනවා කියන එක.

ඉතින්, මෙහෙම පාර්ලිමේන්තුවකින් අපි තව මොනවා බලාපොරොත්තු වෙන්නද? පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයෝ නැහැ. දැන් තුන්දෙනෙක් ඉන්නවා. ඒ ජාතික ජන බලවේගයේ අපේ තුන් දෙනා. අපේ ජනතාව කැමැති මහජන නියෝජිතයාටත් නොවෙයිනේ. මහජන නියෝජිතයෝ කියන්නේ, හිතන මතන, තර්ක කරන, ජනතාව වෙනුවෙන් අරගල කරන කට්ටිය. ඒ අය පැත්තක තියලා, අත් උස්සන කට්ටිය තමයි, ගේන්නේ.

සිග්නල් කණු වාගේ. අම්බලන්ගොඩ රූකඩ වාගේ. එහෙම කට්ටියක් ආවාම ගෝඨාභය රාජපක්ෂ මහත්තයලාට ලේසියි. ඒ නිසා මේක සම්මත කර ගන්න ලොකු අමාරුවක් වෙන්නේ නැහැ. තව අවුරුදු පහකින් වෙන ආණ්ඩුවක් ඇවිදින්, විසිඑකත් ගෙනාවොත් එහෙම ඒ ගොල්ලෝ හිටියොත්, අනිවාර්යයෙන්ම ඒකටත් අත් උස්සවා ගන්න ලේසියි.

## නව ලිබරල්වාදයේ දෙවැනි ඉනිම

ඒ ඔක්කොම තියෙද්දී, විස්ස ගැටගැහිලා තියෙන්නේ, මොකක් එක්කද කියලා අපි බලමු. අපි කලිනුත් කිවුවා වාගේ විසිවැනි සංශෝධනය ගැටගැහිලා තියෙන්නේ, ගෝඨාභය රාජපක්ෂ මහත්තයලාගේ සරල ආශාවන් එක්ක විතරක් නොවෙයි, මේක අපේ රටේ අධිරාජ්‍යවාදී ව්‍යාපෘතිය එක්ක ගැටගැහිලා තියෙන්නේ. මම කලින් කිවුවා වාගේම බැලූබැල්මට විස්ස ගෝඨභයගේ වුණාට ගෝඨාභය බලය ගන්නේ, ඊට පස්සේ තමන්ට කරන්න සිද්ධ වෙන අධිරාජ්‍යවාදීන්ගේ ව්‍යාපෘති කරගෙන යාමට. මේ දැන් තියෙන ආර්ථික ක්‍රමය හඳුන්වන්නේ නව ලිබරල්වාදී ක්‍රමය කියලා බව අපි දන්නවා. මේක 1975 කාලයේ පටන්ගෙන 1980 කාලයේ තහවුරු වුණා. මේකට 'විවෘත ආර්ථිකය' කිවුවා. 'ගෝලීයකරණය' කිවුවා. මේ මොන නමකින් හැඳින්වුවත්, මේක නව ලිබරල්වාදී ක්‍රමය. ධනවාදයේ හා අධිරාජ්‍යවාදයේ නූතන අවතාරය වන නව ලිබරල්වාදය ඇතුළේ සියල්ල විකිණීමට තබා තියෙනවා. දැන් පාර්ලිමේන්තුවේ කට්ටිය විකිණිලා ඉන්නේ. සියල්ල විකුණන කොට තමයි, අධිරාජ්‍යවාදීන්ට අපේ සම්පත් ටික කොල්ලකන්න පුළුවන් වෙලා තියෙන්නේ. මේ ක්‍රමය අපේ රටේ පටන් ගත්තේ ජේ.ආර්. ජයවර්ධන. හැබැයි, ජේ.ආර්.ට මේක පටන් ගත්තාට ඉවර කර ගන්න බැරි වුණා. එනිසා දැන් ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඇවිත් ඉන්නේ, ජේ.ආර්.ගේ දෙවැනි ඉනිම ගහන්න. ඒකේ දෙවැනි ඉනිම සම්පූර්ණ කරන්න. ඒ කියන්නේ, අධිරාජ්‍යවාදීන්ට මේ බිමේ කර ගන්න ඕනෑ කරන තවමත් කර ගන්න බැරි වුණු දේවල් ටික ඉෂ්ට කර ගන්න.

ඒ කියන්නේ, අධිරාජ්‍යවාදීන්ට ඕනෑ කරන කටයුතු ටික මේ බිමෙන්

ඉෂ්ට කර ගන්න.

අධිරාජ්‍යවාදීන්ට ඕනෑ වෙන්නේ අපේ රටේ ඉඩම් වෙළෙඳ භාණ්ඩයක් කරන්න. බහුජාතික සමාගම්වලට ඇවිල්ලා, අපේ ඉඩම් මිලදී ගන්න පුළුවන්කම තියෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් ඉඩම් සම්පත විකුණන්න, මිලදී ගන්න නිදහස් වාතාවරණයක් හදන්න ඕනෑ. දැනුත් රජයේ ඉඩම් ගන්නවා. පෞද්ගලික ඉඩම් ගන්න අමාරුයි. ඒකට තියෙන බාධාව මොකක්ද? අපේ රටේ ඉඩම් ඔප්පු නිරවුල් නැහැ. තියෙන ඔප්පුත් වර්ග ගොඩක් තියෙනවා. 'ජයභූමි' කියයි. 'ස්වර්ණභූමි' කියයි. ඔය වාගේ විවිධ ඔප්පු වර්ග තියෙනවා. මේ ඉඩම් විකුණන්න අමාරුයි. අයිතිකාරයෝ ගොඩක් ඉන්නවා. ඔප්පු නිරවුල් නැහැ. රජයේ ඉඩම් දුන්නොත් ඇරෙන්න පෞද්ගලික ඉඩම් විකුණන්න අමාරුයි. ඒ නිරවුල් නැතිකම නිසා. පහුගිය කාලේ පට්ට ගහපු මාතෘකාවක් තිබුණානේ එම්.සී.සී. ගිවිසුම කියලා. දැන් ඒ ගැන කතා කරන්නේ නැහැ. එම්.සී.සී. ගිවිසුම අත්සන් කළාම ඇමෙරිකාවේ එම්.සී.සී. ආයතනයෙන් ඩොලර් මිලියන භාරසියඅසූවක් දෙන්න පොරොන්දු වෙලා හිටියා. ඒකෙන් සියයට තිහක් වෙන් කරන්න ඕනෑ අපේ රටේ ඉඩම් නිරවුල් කරලා ඔප්පු ලබා දෙන්න. ඇමෙරිකන්කාරයාට පුදුම අමාරුවක් තියෙන්නේ, අපේ රටේ ඉඩම් නිරවුල් කරලා ඔප්පු ලබා දෙන්න. මෙතැන තියෙන්නේ, එහෙම ඔප්පු දුන්නොත් තමයි, අපේ මිනිස්සුන්ට ඉඩම් විකුණන්න පහසුව හැදෙන්නේ. කොම්පැනිකාරයෙක් ඇවිල්ලා, පර්චස් එකට මිල කියලා අපිට විකුණන්න කියලා කිවුවොත්, අමාරුවෙන් ජීවත් වෙන අපේ කට්ටිය ඒ ඉඩම් විකුණලා, ඊට අඩු ගාණකට ඉඩමක් අරන් ගේකුත් හදා ගන්න හිතනවා. අපේ රටේ සාමාන්‍යයෙන් හිතන්නේ එහෙම නේ. ඒ නිසා ඉඩම් වෙළෙඳ භාණ්ඩයක් කරලා බහුජාතික සමාගම්වලට විකුණන්න නීතිරීති ගේන්න ඕනෑකම තියෙනවා. මේ ලෑස්ති වෙන්නේ ඒකට තියෙන බාධාවන්, විරෝධයන් මැඩපවත්වන්න.

අපේ රටේ ජල සම්පත විකුණන්නත් බොහෝ කාලයක ඉඳලා සැලැසුම් තියෙනවා. ලෝකයේ ලොකුම ප්‍රශ්නයක් තියෙනවා, ජලය ගැන. සමහර අය හිතන්නේ, ලෝකයේ ලොකුම ප්‍රශ්නය තෙල් සම්බන්ධව කියලා. නැහැ. ඒක එහෙම නොවෙයි. මේ වෙන කොට ලෝකයේ වටිනාම සම්පත

වෙලා තියෙන්නේ, පානීය ජලය. අපිට තෙල් නැතිව ඉන්න  පුළුවන්. බර කරත්තෙන් හරි යන්න පුළුවන්. හැබැයි, වතුර නැතිව ඉන්න බැහැ. ඒ නිසා පානීය ජල ප්‍රශ්නයක් ලෝකයට තියෙනවා. මේ ධනවාදය ඇතුළේ පරිසරය විනාශ කරලා, පානීය ජල සම්පත විනාශ කරලා තියෙන්නේ. ඒ නිසා පානීය ජලය හොයාගෙන ඒ ගොල්ලෝ එනවා. අපේ රට එහෙම තැනක්. ඒ නිසා අපේ වැව් ටිකට, අපේ ජලාශ ටිකට ඒ ගොල්ලෝ වැඩේ දෙන්න ජල සම්පත හොයාගෙන එනවා. ඒ එන කොට බාධා මතු වෙන්න පුළුවන්කම තියෙනවා. ඒ බාධාවන් මැඩගෙන අපේ ජල සම්පත, ඉඩම් සම්පත, අනෙකුත් ස්වාභාවික සම්පත් ටික බහුජාතික සමාගම් අතට ගන්න එනවා. ඒ එන කොට ඇති විය හැකි විරෝධයන් මැඩපවත්වන්න තනි බලයක් ඕනෑ. ඒ නිසා විස්සෙන් කරන්නේ, ගෝඨාභය රාජපක්ෂට ඕනෑ වෙලාවක අත උස්සන පාර්ලිමේන්තුවකුත්, ඇමති මණ්ඩලයකුත්, ඕනෑම දෙයක් කරන්න පුළුවන් බලයකුත් හදා ගන්න එක. නව ලිබරල්වාදය ඇතුළේ අධිරාජ්‍යවාදීන් ස්වාභාවික සම්පත් ටික ඔවුන්ට මිල දී ගැනීමටත්, ඒ වෙනුවෙන් අවශ්‍ය ක්‍රමය අපේ රට තුළ මුළුමනින්ම හදා ගන්නත් උත්සාහ කරනවා. විස්ස ඕනෑ කරන්නේ ඒකට.

මේකට තව අපේ රටේ කම්කරු නීතිත් අදාළයි. අපේ රටේ ක්‍රියාත්මක සමහර කම්කරු නීති අධිරාජ්‍යවාදීන්ට හරියන්නේ නැහැ. ඒවා කම්කරුවන්ට හොඳයි. ඒ නිසා ඒ නීති වෙනස් කරන්නත් උත්සාහ කරනවා. කම්කරුවන්ට හොඳ නීති වෙනස් කරන්න උත්සාහ කරන කොට කම්කරුවන්ගේ පැත්තෙන් විරෝධයක් එනවා. ඒ වාගේම අපේ රටේ අධ්‍යාපනයත් විකුණන්න ඕනෑ. ඒකට උත්සාහ කරන කොටත් විරෝධයක් එනවා. නව ලිබරල්වාදයට අනුව සියල්ල විකුණන කොට, නීති වෙනස් කරන කොට නිර්මාණය විය හැකි විරෝධය මැඩපවත්වන්න තනි යකඩ හස්තයක් ඕනෑ වෙනවා. ඒක හදන්න තමයි, අධිරාජ්‍යවාදීන්ගේ ආර්ථික ඕනෑකම් වෙනුවෙන් ගෝඨාභය රාජපක්ෂලා මේ නීති ගේන්නේ; රට හෝ ජනතාව හෝ වෙනුවෙන් නොවෙයි. මේ හදන්න යන්නේ ආඥාදායකයෙක්. නිකම් නොවෙයි, ව්‍යවස්ථානුකූල ආඥාදායකයෙක්. ඉස්සර ආඥාදායකයෝ හිටියා ව්‍යවස්ථා නැතුව. දැන් හදන්න යන්නේ ව්‍යවස්ථානුකූල ආඥාදායකයෙක්. ජනතාව බලය දීපු ආඥාදායකයෙක් තමන්ට බලය දීපු ජනතාව තළා පෙළා

තමන්ගේ හාම්පුතුන්ට සේවය කිරීමේ තැනකට අතගහලා තියෙනවා.

## ජේ.ආර්. වෙනුවට ජී.ආර්.

මම මේ කියන්නේ, දිගින් දිගටම එන්නේ 1978 පටන් ගත්තු වැඩේ බව. මේ වර්ගයේ වැඩේ පටන් ගත්තේ, 1978 ජේ.ආර්. ජයවර්ධන මහත්තයා. ඔහු 1977 බලයට ආවේ කුමක් සඳහාද? නව ලිබරල්වාදය ලංකාව තුළ ස්ථාපිත කිරීමේ හීනයක් එක්ක. එයා අපට ඒ ගැන කිවුවේ වෙන උදාහරණයකින්. ඒ තමයි, ලංකාව සිංගප්පූරුවක් කරනවා කියන එක. අපි දන්න භාෂාවෙන් ලංකාව සිංගප්පූරුවක් කරනවා කිවුවේ මොකක්ද? නව ලිබරල්වාදය ලංකාව තුළ තහවුරු කරනවා කියලා. ඒක තහවුරු කරන්න මොනවාද කරන්න ඕනෑ කියලා එයා දන්නවා. රජය සතුව තිබුණු සම්පත් විකුණන්න සිද්ධ වෙනවා. අපේ රටේ ඉඩම් ටික, වැව්, ඇළ දොළ විකුණන්න සිද්ධ වෙනවා. කම්කරු නීති වෙනස් කරන්න සිද්ධ වෙනවා. මේවාට එරෙහිව ජනතා විරෝධයක් එනවා. ඒ විරෝධය පොඩිපට්ටම් කරන්න ශක්තිමත් බලයක් තියෙන්න ඕනෑ. නඩු වැටෙන්නේ නැති බලයක් තියෙන්න ඕනෑ. උසාවි යන්නේ නැති බලයක් තියෙන්න ඕනෑ. වගකියන්නේ නැති බලයක් තියෙන්න ඕනෑ. එයා ඒ බලය හදා ගත්තා. හදා ගත්තා විතරක් නොවෙයි, එයා ඒ බලය පාවිච්චි කළා. මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා අස්වීමේ ලියුම් ටික අරගෙන සාක්කුවේ දා ගත්තෙත් ඒකට. ඊට පස්සේ 1981දී අධ්‍යාපනය විකුණන්න අධ්‍යාපන ධවල පත්‍රිකාව ගෙනාවා. ඒ වෙලාවේදී ශිෂ්‍ය ව්‍යාපාරය දැවැන්ත සටනක් කරලා ඒක පරාජයට පත් කළා. ශිෂ්‍ය ව්‍යාපාරයට විශාල වන්දියක් ගෙවන්න සිද්ධ වුණා ඒ වෙනුවෙන්.

ඊට කලින් කම්කරු පන්ති ව්‍යාපාරයත් පොඩිපට්ටම් කළා, වෘත්තීය සමිති මර්දනය කරන්න නීති ගෙනාවා. එයා යෝජනා කළා වෘත්තීය සමිති වෙනුවට 'සේවක සභා' හදන්න කියලා. වරායෙන් හදන්න පටන් ගත්තා. ඒ සේවක සභාවල කවුද ඉන්නේ? ඒකේ කම්කරු නියෝජිතයොත් ඉන්නවා, හාම්පුත්තුත් ඉන්නවා. දෙගොල්ල දාගත්ත සේවක සභාවක්. ඒකේ වෘත්තීය සමිති නැහැ. නමුත්, කම්කරු පන්තිය ඒකට විරුද්ධ වුණා. ඊට එරෙහිව සටනක් තිබුණා. අවසානය ගත්තොත්, 1980 වැඩ වර්ජනයක් සිද්ධ වෙලා

විශාල කම්කරුවන් පිරිසක් එළියට දාලා තමයි, ජේ. ආර්. ජයවර්ධන මහත්තයා ඒකට මුහුණ දුන්නේ. 1980 ජූලි වර්ජනයේදී ලක්ෂයකට වැඩි කම්කරුවෝ එළියට දැම්මා. සමහරු සිය දිවි නසා ගත්තා. ජේ.ආර්.ලා එයින් නතර වුණේ නැහැ. දිගටම මර්දනකාරී කටයුතු කරගෙන ගියා. එකපැත්තකින් රාජ්‍යයේ ආරක්ෂක අංශ මර්දනය දියත් කරද්දී, අනෙක් පැත්තෙන් තමන්ට අවනත පාතාලයක් හදා ගත්තා. ඒකට ඒ කාලේ කිවුවේ. ජේ. ආර්.ගේ තග් සංස්ථාව කියලා. ජනතාව බියවද්දමින්, වෘත්තීය සමිති බියවද්දමින්, ශිෂ්‍ය ව්‍යාපාරය බියවද්දමින්, දේශපාලන පක්ෂ බියවද්දමින් මේ විදියට කටයුතු කරගෙන ආවා. තමන්ගේම පක්ෂයේ ඉන්න අය පවා බියවැද්දුවා. අසූදෙකේ ජනාධිපතිවරණයෙන් ජේ. ආර්. ආපහු දිනුවාට පස්සේ අසූතුනේදී තියන්නට නියමිතවූ මහා මැතිවරණය තිබ්බේ නැහැ. මහා මැතිවරණය නොතියා, ජනමත විචාරණ ප්‍රෝඩාවක් කරලා ආයෙත් වතාවක් හයෙන් පහේ බලය සහිත පාර්ලිමේන්තුව තියා ගත්තා. ජේ. ආර්. කටයුතු කළේ එහෙමයි.

ඊට පස්සේ 1983දී ජාතිවාදී කෝලාහල ඇතිකරලා පක්ෂ තහනම් කළා. අපේ පක්ෂය, නව සමසමාජ පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය තහනම් කළා. කිසිදු සාධාරණ හේතුවක් නැතිව මෙහෙම තහනම් කළේ කුමක් සඳහා ද? තමන් ගෙනියන මේ නව ලිබරල්වාදී ප්‍රතිපත්තියට එරෙහිව සටන් කරන බලවේග ලෙස ජනතා විමුක්ති පෙරමුණ දැක්කා. පස්සෙදී නව සමසමාජ පක්ෂයේ, කොමියුනිස්ට් පක්ෂයේ  තහනම් ඉවත් කළා. හැබැයි, ජනතා විමුක්ති පෙරමුණේ තහනම ඉවත් කළේ නැහැ. ඒ විතරක් නොවෙයි, අපට මතකයි 1987 ජේ. ආර්. ජයවර්ධන ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කළා. කාගෙන් අහලාද අත්සන් කළේ? අඩු ගාණේ ඇමති මණ්ඩලය දන්නේ නැහැ. අගමැති දන්නේ නැහැ. ඇමති මණ්ඩලයට කියන්නෙත් නැතිව තනි කැමැත්තට ඉන්දු - ලංකා ගිවිසුම අත්සන් කළා. ඒ ගිවිසුම අත්සන් කරලා, ඉන්දියානු හමුදාව ලංකාවට ගෙනාවා. තනි බලය ගත්ත කට්ටිය හැසිරිලා තියෙන්නේ එහෙමයි. ඉන්දු - ලංකා ගිවිසුමට එරෙහිව රටේ දැවැන්ත සිවිල් යුද්ධයක් නිර්මාණය වුණා. අපිත් ඒකේ කොටස්කාරයෝ වෙලා හිටියා. දැන් මොකුත් දන්නේ නැති කට්ටිය අසූඅට, අසූනවය කියලා කෑ ගහන්නේ ඒකට. ඒක නිකම් ඇති වෙච්ච එකක් නෙවෙයි. ඒවා ජේ. ආර්. ජයවර්ධනගේ

ව්‍යවස්ථාවෙන් හදපු තත්වයන්. ඒ මොකක්වත් දන්නේ නැතිව ගිරව් වාගේ අසූඅට, අසූනවය කියලා නිකම් කෑ ගහනවා. ලංකාව ඉන්දියාවත් එක්ක ගිවිසුමක් අත්සන් කරලා, ලංකාව ඉන්දියාවට පාවා දීලා, ඉන්දියානු හමුදාව ගෙනැල්ලා අපේ රටේ ස්වෛරීත්වය, ස්වාධීනත්වය නැති කරලා, මේක ඉන්දියාවේ කොලනියක් බවටත් පත් කරන්න යන කොට ඊට එරෙහිව එදා සටන් කළා.

ඒ සටනේ පෙරමුණේ අපි හිටියා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටියත් ඒ සටනේ හිටියා. මට මතකයි, සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය ඇවිල්ලා, කොටුවේ බෝ ගහ ළඟ වාඩිවෙලා උපවාස කළා, ගිවිසුම අත්සන් කළ දවසේ. ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කට්ටිය 88 ගැන දැන් ඔය බොරුවට කෑ ගහනවා. ජේ.ආර්. වැඩ කළේ එහෙම. හැබැයි, ඒ ඔක්කොම කරලත් අපේ රටේ වමේ ව්‍යාපාරයේ තිබුණු ශක්තිය නිසාත්, ශිෂ්‍ය ව්‍යාපාරයේ තිබුණු ශක්තිය නිසාත්, අපේ රටේ වෘත්තීය සමිති ව්‍යාපාරයේ තිබුණු ශක්තිය නිසාත්, අපේ රටේ වාමාංශික චින්තනය බරපතළ විධියට තිබුණු නිසාත් ජේ.ආර්.ට ඒ වැඩේ ඉවර කර ගන්න බැරි වුණා. අපේ රටේ ජනතාවගේ චින්තනය තුළ ඒ කාලයේ වාමාංශික ව්‍යාපාරය වෙත ලොකු නැඹුරුවක් තිබුණා. ඒ නිසා ජේ.ආර්. ජයවර්ධනට අවශ්‍ය වැඩ ටික ඒ ආකාරයෙන්ම කර ගන්න බැරිවුණා.

ජේ.ආර්.ට කර ගන්න බැරි වුණු වැඩ ටික ජේ.ආර්.ගේ බෑනා, රනිල් වික්‍රමසිංහ මහත්තයා 2002දී කර ගන්න සැලැසුම් කළා. 'රිගේනිං ශ්‍රී ලංකා' ගෙනාවේ ඒකට. සිංහලෙන් 'යළි පුබුදමු ශ්‍රී ලංකා' කිවුවේ ඒ වැඩපිළිවෙළට. මේක ගෙනැල්ලා, අපේ රටේ වැව් ටික විකුණන්න, අපේ ඉඩම් ටික විකුණන්න ව්‍යාපෘති හැදුවා. ඒවා පරද්දන්න අපට සිද්ධ වුණා. අපි ඒවා පැරැද්දුවා. දැන් වෙන්නේ මොකක්ද? ඒ කාලේ ඒවාට විරුද්ධයි කියලා හිටපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වර්තමාන කණ්ඩායම මහින්ද මහත්තයා, ගෝඨාභය මහත්තයා යන අයගේ කණ්ඩායම විදියට ඇවිල්ලා, ලෑස්ති වෙන්නේ ජේ.ආර්.ට බැරි වුණු වැඩේ කරන්න ගෝඨාභයට අවස්ථාව දෙන්න. අධිරාජ්‍යවාදීන්ට ජේ.ආර්. එක්ක කර ගන්න බැරි වුණ වැඩේ, අධිරාජ්‍යවාදීන්ට රනිල් ලවා කර ගන්න බැරි වුණ වැඩේ කර ගන්න දැන්

අධිරාජ්‍යවාදීන් ලෑස්ති වෙලා තියෙනවා, කලක් තමන්ගේ රටේ පුරවැසියෙක් වෙලා හිටපු ගෝඨාභය රාජපක්ෂ මහත්තයා පාවිච්චි කරලා, ඒ වැඩේම කර ගන්න. අදත් එයා එහේ පුරවැසියෙක්ද කියලා අපි දන්නේ නැහැ. ඒ නිසා විස්ස කියන්නේ, ඉතා පැහැදිලිව ගත්තොත්, අධිරාජ්‍යවාදයේ, නව ලිබරල්වාදී ව්‍යාපෘතිය කරගෙන යන්න අධිරාජ්‍යවාදී අරමුණු වෙනුවෙන් අපේ රටේ සමාජ ව්‍යාපාර යටපත් කරමින්, මේ ආර්ථිකය ගෙන යාම සඳහා අවශ්‍ය කරන බලය නිර්මාණය කර ගැනීමේ ව්‍යාපෘතියක්. ඒ ඇරෙන්න වෙන මොකක්වත් මේක ඇතුළේ නැහැ.

## විකටයාට ඇඳීම

ඒ නිසා අපි කවුරුවත් මේවායේ මතුපිටින් බලලා රැවටෙන්න ඕනෑ නැහැ. මේ ගොල්ලන්ගේ සමානකම් ගොඩක් තියෙනවා. අසමානකමුත් ටිකක් තියෙනවා. ඒ කාලේ ජේ.ආර්. ජයවර්ධන මහත්තයට 'යැංකි ඩිකී' කියලා සුරතල් නාමයක් තිබුණා අපට මතකයි. ඒ තරම්ම එයා එක්සත් ජනපදයට කිට්ටුයි. දැන් ඉන්න ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ඊට වඩා අඩු නැහැ. ඔහු ඇමෙරිකානු පුරවැසියෙක් වෙලා සෑහෙන කාලයක් හිටියා. තාමත් එයාගේ දරුපවුල් ඇමෙරිකානු පුරවැසියෝ. බැසිල් රාජපක්ෂ මහත්තයා එයාගේ ඇමෙරිකානු පුරවැසිකම අයින් කරන්නේ නැහැ කියලා කිවුවා. ඒ ගොල්ලෝ යැංකි ඩිකීට එහා ඇමෙරිකානු ගැති කට්ටිය. මෙච්චර රටට ආදරය කරන මිනිස්සු නම්, ඇමෙරිකාවේ පුරවැසිකම තියාගෙන ඉන්නේ මොකටද? මෙච්චර රටට ආදරය කරනවා නම්, ඇමෙරිකානු පුරවැසිකම අයින් කරලා, මෙහෙට එන්න එපැයි. මේ රට හදන්න නොවෙයි, රට කන්න යන්නේ ඒ ගොල්ලෝ. මේක ශුද්ධ කරගෙන යන්න යන්නේ ඒ ගොල්ලෝ. එදා යැංකි ඩිකීගේ තත්වයට එන්න අද ගෝඨාභය උත්සාහ කරනවා. හැබැයි, ජේ.ආර්. නියෝජනය කළේ නව ලිබරල්වාදයේ ආරම්භක කාලය. නමුත්, අවාසනාවකට වාගේ අද ගෝඨාභයට සිද්ධ වෙලා තියෙන්නේ, ඒකේ අවසන් කඩඉම නියෝජනය කරන්න. ඒ නිසා ජේ.ආර්. කරපු හපන්කම් ටිකවත් ගෝඨාභයට කරන්න වෙන්නේ නැහැ කියලා අපි හොඳටම දන්නවා.

එදා ජේ. ආර්. ජයවර්ධන මහත්තයා තමන්ගේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න තමන් අතේ බලය තියාගෙන එවෙලේ ආණ්ඩුවේ හිටපු දක්ෂ කට්ටිය යොදා ගත්තා. ගාමිණී දිසානායකලා, ලලිත් ඇතුලත්මුදලිලා වාගේ කට්ටිය යොදාගෙනයි, ඒ වැඩේ කළේ. අද ගෝඨාභයට එහෙම කට්ටිය නැහැ. ඒ වාගේ දක්ෂයෝ නැහැ. ඉන්න ඔක්කොම කවටයෝ ටිකක්. රජ වාසල කවටයෝ වාගේ. ඒ ගොල්ලොත් එක්ක මේ වැඩේ කර ගන්න බැහැ. ඒ නිසා තනියමයි, කර ගන්න වෙලා තියෙන්නේ. ඒවා කරන්න ගියාම එයාත් කවටයා වෙනවා. ඒ නිසානේ පොඩි පොඩි ආයතනවලට යන්නේ. ඉඩම් නඩු බේරන්න යනවා, ගෙවල් නඩු බේරන්න යනවා. ජනාධිපතිවරයෙක් කරන වැඩද මේවා? ග්‍රාමසේවක මහත්තයෙක් කරන වැඩ කරන්න ජනාධිපති යන්නේ මොකටද? දැන් මේ කරන්නේ කණ්ඩායමක් නැති, තේරුමක් නැති, දක්ෂකමක් නැති දුර්වල ධනපති නායකයෙක් ව්‍යවස්ථා සංශෝධනයකින් බලවත් වෙන්න හදන එක. ගෝඨාභය වටේ ඉන්න අය බලන්නේ මේ කුණු කාණුවෙන් දෝතක් ගන්න. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ජේ. ආර්.ට අඳින්න හැදුවාට අඳින්න බැහැ කියලා අපට හොඳටෝම තහවුරුයි. ඒක කරන්න බැහැ. අඳින්න පුළුවන් කවටයාට, විකටයාට විතරයි. මොකද? ඒ කාලය නෙමෙයි, මේ කාලය. ඒ බව මතක තියාගන්න ඕනෑ.

ගෝඨාභය රාජපක්ෂ මහත්තයලා, මහින්ද මහත්තයලා මේ රටට කළ විනාශයක් තියෙන බව අපි දන්නවා. ප්‍රධාන වශයෙන්ම පහුගිය අවුරුදු දහය දොළහ තුළ මේ රටේ මිනිසුන්ගේ චින්තනය විනාශ කළා. මේ රටේ ජනතාවට තිබුණු ප්‍රගතිශීලී, වමට බර චින්තනය විනාශ කරලා, අන්ත ජාතිවාදී, අන්තවාදී නරුම චින්තනයක් හදලා තියෙනවා. ඒක තාවකාලිකව මේ අයට වාසි වෙලා තියෙනවා. නමුත්, අපි කියන්නේ, මේක හැමදාම තියාගන්න බැහැ කියලා. මිනිස්සුන්ට ඇත්තට මුහුණ දෙන්න වෙන දවසක් එනවා. මේ රැවටිලි, මායාවල්, බොල් ප්‍රතිරූප පස්සේ කොච්චර ගියත්, තමන්ගේ ජීවිතයේ ඇත්තට මුහුණ දෙන්න වෙන දවසක් එනවා එනවාමයි. ඒ බව අපි හොඳටම දන්නවා. එදාට ඔය ගෝඨාභය රාජපක්ෂ මහත්තයලා හදා ගත්ත බොරු ප්‍රතිරූප බිඳ දාගෙන ඔය ජනතාවම ගෝඨාභය රාජපක්ෂ මහත්තයලාට විරුද්ධව රොද බඳිනවා කියන විශ්වාසයත් අපිට හොඳටෝම

තියෙනවා. ඒ විශ්වාසයෙන් තමයි, අපි දේශපාලනය කරගෙන යන්නේ.

ඒ නිසා සහෝදරවරුනි, සහෝදරියනි මේකෙ තියෙන්නේ වෙන කිසිවක් නොවෙයි, අධිරාජ්‍යවාදීන්ගේ ව්‍යාපෘතිය ලංකාව තුළ ක්‍රියාවට නැඟීමට දුර්වල, බෙලහීන ධනවාදය පවත්වාගෙන යාම සඳහා කීයක් හරි හොයා ගන්න දරන උත්සාහයක්. එහෙම නැතිව මේ ක්‍රමය පවත්වාගෙන යන්න බැහැ. අපේ රටේ ධනවාදය අද හොඳටම දුර්වල බව අපි දන්නවා, රට පවතින්නේ ණය කන්දරාවක් මත. තවත් ණය ගන්නවා ඇරෙන්න වෙන උත්තරයක් නැහැ. ණය, ණය, තව තවත් ණය! හාල් ගේන්නත් ණය ගන්නවා. ණය මත යැපෙන රටක්. නිෂ්පාදනයක් නැති රටක් හදලා තියෙන්නේ. අවුරුදු හැත්තෑදෙකක් තිස්සේ දෙගොල්ලොම කරලා තියෙන්නේ මේක. ඒ නිසා රට තුළ දැවැන්ත සමාජ - ආර්ථික අර්බුදයක් තියෙනවා. මේ පාලකයන්ට ඒකෙන් ගොඩ එන්න බැහැ. ගොඩ එන්න මේ ගොල්ලෝ කරන්නේ, තව තවත් ණය ගැනීමයි, අධිරාජ්‍යවාදීන්ට යට වීමයි, හිලව්වට අපේ රටේ සම්පත් ඔවුන්ට ලබා දීමයි විතරයි. එහෙම කරන්න ගියාට පස්සේ අනිවාර්යයෙන්ම ඊට එරෙහිව ජනතා ප්‍රතිචාරයක් එනවා. අන්න ඒ ජනතා ප්‍රතිචාරය ආණ්ඩුවට අහිතකර නිසා එවැනි ප්‍රතිචාර මර්දනය කරලා, යටපත් කරලා, අධිරාජ්‍යවාදී ව්‍යාපෘති කරගෙන යන්න ඕනෑ කරන බලයක් නිර්මාණය කර ගන්නයි විසිවැනි සංශෝධනය ගේන්නේ.

## ශිෂ්ට සම්පන්න සමාජයක්

ඒ නිසා මේක පැහැදිලිවම අධිරාජ්‍යවාදී ව්‍යාපෘතියත් එක්ක ගැට ගැහුණු එකක්. ඒ නිසා මේක පරද්දන්න එක්සත් ජාතික පක්ෂයටත් බැහැ. එක්සත් ජාතික පක්ෂයෙන් බෙදිලා ගිය සජිත් ප්‍රේමදාස මහත්තයලාටත් බැහැ. සමහරු හිතාගෙන ඉන්නවා, දැන් ආපහු "ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් ඔක්කෝම එකතු කරමු" කියලා. එහෙම කාලයක් තිබුණා. කට්ටිය එහෙම එකතුත් වුණා. ඒ එකතු වෙච්ච කට්ටිය තමයි, ගෝඨාභය මහත්තයාට එන්න පාර කැපුවේ. ඒ නිසා මේ සටන කරන්න වෙන්නේ, නව ලිබරල්වාදය ගෙනාපු මේ පාලක කණ්ඩායම්වල තවත් කොටසක් වුණු එක්සත් ජාතික පක්ෂයේ රනිල්, සජිත් කියන කොයි කණ්ඩායම එක්කවත් නෙවෙයි. මේ

ප්‍රශ්නයේ මතුපිටින් අල්ලාගෙන ඊළඟ බල ව්‍යාපෘතියට පාවිච්චි කරන තක්කඩි කණ්ඩායම් එක්ක මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. මේ ප්‍රශ්නය විසඳන්න වෙන්නේ, අවංකවම රට වෙනස් කරන්න කැමැති, අවංකව මේ රටේ සමාජ වෙනසක් සඳහා අධිෂ්ඨානය සහිතව වැඩ කරන, මේ රටේ මහජනතාව බලගන්වන්න අවංකවම වැඩ කරන, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය සැබෑ අර්ථයෙන්ම බලගන්වන්න අවංකවම කැමැත්ත තියෙන සහ ඒ වෙනුවෙන් දිගුකාලීනව කැප වෙන්න ලෑස්ති සංවිධාන එක්ක පමණයි. එවැනි සංවිධාන තියෙන බව අපි දන්නවා. ගොවි සමිති. වෘත්තීය සමිති, කාන්තා සංවිධාන, ශිෂ්‍ය සංවිධාන, ජනතා සංවිධාන ගොඩක් තියෙනවා. අපිට එහෙම ජනතාවක් ඉන්නවා. එවැනි බලවේගයන්ගේ එකතුවකින් තමයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කම තියෙන්නේ. අපට ජාතික ජන බලවේගය තියෙනවා.

අපි ඔබට කියන්නේ, මේක දෙබිඩි ආණ්ඩුවක්. මේ ආණ්ඩුවේ දෙබිඩි රංගනය නිමාවට පත් කිරීමේ ක්‍රියාමාර්ග දැන් ඇවිත් තියෙනවා. ජනාධිපතිකම ගන්න කලින්, මහ ඡන්දයට කලින් කියපු කතාන්දර ඔක්කොම දැන් බොරු වෙලා තියෙන්නේ. ඒ බව දැන් ඔප්පු කරමින් එනවා. එම්.සී.සී. එකට විරුද්ධව කෑ ගහපු කට්ටිය දැන් ගොළු වෙලා ඉන්නේ. ඇයි? එම්.සී.සී. ගිවිසුම අත්සන් කරන්න සිද්ධ වෙන නිසා. විනය හදන්න ඕනෑ කියපු කට්ටිය දැන් කතා නොකර යනවා. ආර්ථිකය ගැන කතා කරපු කට්ටිය දැන් කතා නොකර යනවා. පොල්වල ගණන් අහපු කට්ටිය දැන් අහන්නෙ නැතිව යනවා. දැන් සැපද කියලා අහපු මහින්ද රාජපක්ෂ මහත්තයාම එහෙම අහන එක හොඳ නැහැ කියලා කියනවා. විල්පත්තුව ගැන කෑ ගහපු අය දැන් සිංහරාජය ගැන, වනාතවිල්ලුවේ ඉඩම් සංහාරය ගැන මුනිවත රකිනවා. ඒ ගොල්ලන්ගේ දෙබිඩිකම මතු වෙලා ඇත්ත පේන්න දැන් පටන්ගෙන තිබෙනවා. නිරුවත හෙළි වෙන්න පටන්ගෙන තිබෙනවා. මේ විස්ස විසිනුත් ඒ ගොල්ලෝ කරලා තියෙන්නේ, ඒ ගොල්ලෝ ඇත්තටම කවුද කියන එක ජනතාවට හෙළි කිරීම. ඒ ගොල්ලන්ට ඡන්දය දීපු හැටනව ලක්ෂයක් අතරේ ප්‍රජාතන්ත්‍රවාදය ගැන විශ්වාසය තියපු අයට මෙතරම් ඉක්මනින් මේ අයගේ ඇත්ත තත්වය ඔප්පු කරපු එක ගැන අපි ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට ස්තුතිවන්ත වෙන්න

ඕනෑ.

අපි හිතනවා, හැටනව ලක්ෂයක් අතර පිරිස වෙනස් වෙයි කියලා. ඒ ගොල්ලෝ වෙනස් වෙන්න ඕනෑ. හැටනව ලක්ෂය අයිති ඒ ගොල්ලන්ට නොවෙයි. ඒ මොහොතේ දේශපාලන තත්ත්වය තේරුම් ගන්න බැරිව ඒ ගොල්ලන්ව විශ්වාස කළ ජනතාව තමයි, පීඩාවට පත් වෙන්නේ. ඒ නිසා ඒ ජනතාවට සිද්ධ වේවි, තමන් විසින් හැදුව ආණ්ඩුවේ ජනතා විරෝධී කටයුතුවලට එරෙහිව සටන් කරන්න. විසිවැනි සංශෝධනය ඉතාමත්ම නරක එකක්. ඒක ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කරන එකක්. ඒක මේ රට අධිරාජ්‍යවාදීන්ගේ වහල් කඳවුරක් බවට පත් කිරීමට අවස්ථාව හදලා දෙන එකක්. ඒ නිසා ඒක බරපතළයි. පරද්දන්න ඕනෑ. ඒක පරද්දන්න ඕනෑ විසිවැනි සංශෝධනය ගැටගහලා තියෙන ඒකාධිපති ව්‍යවස්ථාවත් එක්ක. ඒ ඒකාධිපති ව්‍යවස්ථාව හදලා තියෙන්නේ, මේ පවතින සමාජ-ආර්ථික දේහය මත; නව ලිබරල්වාදය මත. මේවාත් එක්කයි, විස්ස පරද්දන්න ඕනෑ. ඒ නිසා අපි ඔබට ආරාධනා කරනවා, අපි එකතු වෙලා වැඩ කරමු; කතා කරමු; අපි සංවාද කරමු; අපි ඉගෙන ගනිමු. සියලු බලවේග ඒකරාශී කරමු. කුමක් සඳහාද? විස්ස පරද්දන්න විතරක් නොවෙයි, විස්සට එහා ගිහිල්ලා, විසිවැනි සංශෝධනය ගේන්න බල කෙරෙන මේ තක්කඩි දේශපාලන සංස්කෘතිය, මේ දූෂිත දේශපාලන සංස්කෘතිය, හොරකම එකම දහම කර ගත්තු, බලය ලබා ගැනීම එකම දහම කර ගත්තු මේ දේශපාලන සංස්කෘතිය පරද්දන්න ඕනෑ.

ඒ වෙනුවට පොදු ජනතාවගේ අයිතිවාසිකම් රැකෙන, ආර්ථිකයක්, සමාජයක්, සංස්කෘතියක් නිර්මාණය වෙන පොදු ජනතාවගේ අයිතිවාසිකම් රැකෙන ව්‍යවස්ථාවක් නිර්මාණය වෙන සමාජ ක්‍රමයකට අපි පය තියන්න ඕනෑ. එවැනි සමාජයක් නිර්මාණය කිරීම වෙනුවෙන් අපි බලවේග ඒකරාශී කරන්න ඕනෑ. ඒ නිසා මේක විස්ස ලෙස පටුවට ගන්නේ නැතිව වත්මන් සමාජ අර්බුදයේ ප්‍රකාශනයක් ලෙස තේරුම් ගන්න ඕනෑ. වත්මන් ධනවාදී අර්බුදයේ සමාජ ප්‍රකාශනයක් ලෙස අපි තේරුම් ගන්න ඕනෑ. මේ පාලකයන්ට මීට වඩා යමක් කරන්න බැහැ. ඒ බව තේරුම් අරගෙන අර්බුදකාරීත්වයෙන් මේ සමාජය මුදාගෙන වඩාත් සාධාරණ සමාජයක්

සඳහා අපි ඉස්සරහට යන්න ඕනෑ. ඒ වෙනුවෙන් බලවේග එකතු කරන්න ඕනෑ. එවැනි සමාජයකදී අනිවාර්යයෙන්ම ජනතාවගේ ව්‍යවස්ථාවක් නිර්මාණය වෙන්න ඕනෑ. ඒ සඳහා අපි වැඩ කරමු; සටන් කරමු. අපි අවධාරණයෙන් කියන්නේ, ජනතා විමුක්ති පෙරමුණේ අපි මේ සටනේ පෙරමුණෙන්ම ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණ කවදාවත් ලැබෙන ඡන්ද සංඛ්‍යාවෙන් අපේ වැඩවල ප්‍රමාණය තීරණය කරන්නේ නැහැ. අපට ඉන්න මන්ත්‍රී සංඛ්‍යාව මත අපි වැඩ කරන්නේ නැහැ. අපට ඡන්දය දුන්නේ නැහැ කියලා, අපි තරහා වෙන්නේ නැහැ. ඡන්දය කාට දුන්නත්, අපි හැමදාම මේ රටේ පීඩාවට පත් වුණු ජනතාවට ආදරය කළ මිනිස්සු. අදත් ආදරෙයි. හෙටත් ආදරෙයි. මතු මතුත් ආදරෙයි. අපේ පන්තියට අපි ආදරෙයි.

ඒ නිසා මේ රටත්, මේ රටේ ජනතාවත් අනිවාර්යයෙන්ම හොර කල්ලියෙන් මුදා ගන්න ඕනෑ. මේ ඒකාධිපති කල්ලියෙන් මුදාගන්න ඕනෑ. අපේ රටත්, ජනතාවත් මේ දුෂ්ට ඒකාධිපති කල්ලියෙන් මුදාගෙන වඩා යහපත් සමාජයක්, නව සමාජවාදී සමාජයක් වෙත ගෙනයන්න ඕනෑ. ඒ සඳහා වන ව්‍යවස්ථාවක් නිර්මාණය කරන තැනකට ගෙනයන්න ඕනෑ. ඒ සඳහා සියලු බලවේග එකතු කරමු; ජනතාව එකතු කරමු; ජනතාව දැනුවත් කරමු; ජනතාව සංවිධානය කරමු. ඒ සඳහා අපි එකට අත්වැල් බැඳගෙන සටන් කරමු. ජයග්‍රහණය දක්වා අපි සටන් කරමු. අවසානයේ ජනතාව ජයග්‍රහණය කරන බවට විශ්වාසය අපට තියෙනවා. වඩා යහපත් සමාජයක් වෙනුවෙන් අපේ සටන අත්නොහැර, නතර නොවී ධෛර්යයෙන් යුතුව සටන් කිරීමට ශක්තිය ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ජයවේවා!



අප 20වැනි සංශෝධනය දෙස බැලිය යුත්තේ මෙම පදනම මත පිහිටාය. 20වැනි සංශෝධනය යනු ගෝඨාභයගේ පුද්ගල හිතුවක්කාරකමක හෝ කැමැත්තක ප්‍රතිඵලයක්ම නොවේ. ඔහුට එවැනි කැමැත්තක් තිබිය හැකි වුවත් '20' පිටුපස වන සැබෑ අරමුණ වන්නේ ලංකාවේ දුර්වල, පසුගාමී ධනවාදය නව ලිබරල්වාදී ව්‍යාපෘතිය තුළ රැගෙනයාමේදී මතුවන ප්‍රතිවිරෝධයන්ට මුහුණ දිය හැකි තනි ඒකාධිපති බලයක් නිර්මාණය කර ගැනීමය. එබැවින් '20' අධිරාජ්‍යවාදයේ සමාජ ආර්ථික වුවමනා සමග ගැටගැසී පවතී.

නියමුවා ප්‍රකාශන

දුරකථනː- +94112785612
ෆැක්ස්ː- +94112786050
ඊ-මේල්ː- niyamuwa@jvpsrilanka.com
වෙබ්ː- www.jvpsrilanka.com

ආධාරය රු. 50/=